# සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


ඉදිරිපත් කිරීම

**අජිත් නිවාඩ් කබ්රාල්**
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව


2021 ඔක්තෝබර් 01

**“ආසියාවේ ආශ්චර්යය"**

ලෙස වරෙක අභිමානයෙන් හැදින්වූ

**ශ්‍රී ලංකාව**

පසුගිය වසර කිහිපය තුළ

දැඩි අභියෝගයට

ලක් විය...



# වර්තමාන ආර්ථික අභියෝග පිළිබඳව තැතිගැන්මක් පවතී...

මන්දගාමී ආර්ථික වර්ධනය සහ පීඩාවට පත්ව ඇති ව්‍යාපාර

කොවිඩ්-19 ආශ්‍රිත සමාජ හා ආර්ථික කටයුතු සීමා කර තැබීම් හේතුවෙන් ඇති වූ දැඩි බලපෑම

විදේශ විනිමය හිඟය සහ ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම පිළිබඳව පවතින බිය

අක්‍රිය ණය ඉහළ යෑමට ඇති හැකියාව

විශේෂයෙන් ම නොපියවා ඇති විශාල ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වගකීම හේතුවෙන් රාජ්‍ය ණය තිරසාරභාවය පිළිබඳව පවතින අවදානම්

මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය ඉහළ යෑම



පහළ මට්ටමේ පවතින නිල විදේශ විනිමය සංචිත

දුර්වල ආදායම

නිල නොවන ප්‍රේෂණ ප්‍රවාහ ඉහළ යෑම

අහිතකර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම්

ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දී ඇති පාරිභෝගිකයින්

ආනයනකරුවන් විසින් ආනයනික භාණ්ඩ තොග රැස් කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් දැඩි අභියෝගයන්ට ලක්වෙමින් පැවතීම

එදිරිවාදී දේශීය හා විදේශීය මාධ්‍ය වාර්තා

අපනයනකරුවන් විසින් විදේශ විනිමය රැස් කිරීම

විශ්වසනීයත්වය පිරිහීම

# විපක්ෂය සහ අනෙකුත් කණ්ඩායම් විසින් නිතිපතා සෘණාත්මක වාර්තා පළ කිරීම ද අයහපත් මත ඇතිවීම කෙරෙහි දායක වී ඇත...

**නව මූල්‍ය උපායක් රටට අවශ්‍යයි**

MP notes a hidden aspect of Sri Lanka's debt

5 August 2021 12:01 am - 0 - 1302

''ජනපති ප්‍රයත්නය ලත් තැන ම ලොප් වෙලා''

**රසායනික පොහොරවලින් ඉවත් වීම එක්වරම ක්‍රියාත්මක කළොත් ගොවීන් ගොවිතැනින් ඈත් වේවි**

Current lockdown imposed by Govt. is a failure - Opposition Leader

28 Aug 2021 - 387

- Those who have succumbed to COVID in SL has become twice as many as those who have died of the pandemic in China
- Ministers are putting the lives of people in this country on auction

Home | Economy & Markets | Industry | Opinion | Politics | Other | Events | LBO T

"Be careful of pump and dump in stock market"

"This govt. printed Rs. 880 billions"

13 Jul 2021 - 6611

This is the roadmap of Zimbabwe

- **Economy a step closer to bankruptcy**

Change the doctor rather than changing the medication to resolve country's problems



Projects such as Nelum Kuluna and Hambantota Conference Hall do not directly benefit the people or the country; implementing such projects making use of loans is not an appropriate decision

# එමෙන්ම, පසුගිය වසර කිහිපය තුළ ආර්ථිකයේ ඇති වූ ප්‍රගතිය ඉතා සුළු බව අපට පිළිගැනීමට සිදු වේ...

| | 2005 | 2014 | 2019 | 2020 |
|---|---|---|---|---|
| පවත්නා මිල අනුව ද.දේ.නි. (එ.ජ.ඩොලර් මිලියන) | 24,406 | 79,359 | 83,976 | 80,707 |
| පවත්නා වෙළඳපොළ මිල අනුව ඒක පුද්ගල ද.දේ.නි. (එ.ජ.ඩොලර්) | 1,242 | 3,819 | 3,852 | 3,682 |
| වෙළඳ භාණ්ඩ අපනයන (එ.ජ.ඩොලර් මිලියන) | 6,347 | 11,130 | 11,940 | 10,047 |
| වෙළඳ භාණ්ඩ අපනයන (ද.දේ.නි.යේ % ලෙස) | 26.0 | 14.0 | 14.2 | 12.4 |
| සේවා අපනයන (එ.ජ.ඩොලර් මිලියන) | 1,539 | 5,605 | 7,474 | 3,035 |
| සේවා අපනයන (ද.දේ.නි.යේ % ලෙස) | 6.3 | 7.1 | 8.9 | 3.8 |
| විදේශීය ජංගම ගිණුමේ ශේෂය (ද.දේ.නි.යේ % ලෙස) | (2.7) | (2.5) | (2.2) | (1.3) |
| සමස්ත රාජ්‍ය මූල්‍ය ශේෂය (ද.දේ.නි.යේ % ලෙස) | (7.0) | (5.7) | (9.6) | (11.1) |
| මධ්‍යම රජයේ ණය (ද.දේ.නි.යේ % ලෙස) | 90.8 | 72.3 | 86.8 | 101.0 |
| මධ්‍යම රජයේ විදේශීය ණය (ද.දේ.නි.යේ % ලෙස) | 39.0 | 30.0 | 41.3 | 40.4 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ද.දේ.නි.යේ % ලෙස) | - | 6.3 | 17.9 | 17.4 |
| සාමාන්‍ය විනිමය අනුපාතය (රුපියල්/එ.ජ.ඩොලර්) | 100.50 | 130.56 | 178.78 | 185.52 |
| වසර අවසාන විනිමය අනුපාතය (රුපියල්/එ.ජ.ඩොලර්) | 102.12 | 131.05 | 181.63 | 186.41 |
| දළ නිල සංචිත (එ.ජ.ඩොලර් මිලියන) | 2,735.0 | 8,208.4 | 7,642.4 | 5,664.3 |
| උද්ධමනය (කො.පා.මි.ද.හි වෙනස) | 11.0 | 3.3 | 4.3 | 4.6 |
| සියලු කොටස් මිල දර්ශකය (1985=100) | 1,922.2 | 7,299.0 | 6,129.2 | 6,774.2 |
| කොටස් වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (එ.ජ.ඩොලර් බිලියන) | 5.7 | 23.7 | 15.7 | 15.9 |

# කොවිඩ් -19 වසංගතයේ බලපෑම ද සමඟ ආර්ථිකය දුර්වල වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථාවරභාවය සහ තිරසාරභාවය පිළිබඳව චකිතයක් උද්ගතව තිබේ...




Sources: Various Media Reports

# 2021 වසරේ පළමු භාගයේ දී ආර්ථිකය 8.0% කින් වර්ධනය වුව ද, වසංගතය හේතුවෙන් ශ්‍රම වෙළඳපොළට සිදු වූ අවහිරතා නිරීක්ෂණය කළ හැකි විය...

## වාර්ෂික ද.දේ.නි. වර්ධන අනුපාතිකය (වාර්ෂික ලක්ෂ්‍යමය)




*Source*: Department of Census and Statistics

## කාර්තුමය මූර්ත ද.දේ.නි වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය ) සඳහා දායකත්වය




*Source*: Department of Census and Statistics

## සම රටවල් හා සාපේක්ෂව නැවත යථා තත්ත්වයට පත් වීම (2020Q2 සහ 2021Q2)




*Source* : Department of Census and Statistics

## සේවා වියුක්තිය




*Source* : Department of Census and Statistics

# කොවිඩ්-19 වසංගත තත්ත්වයේ අහිතකර බලපෑම් මධ්‍යයේ විදේශීය අංශය පෙර නොවූ ආකාරයේ අභියෝගයන්ට මුහුණ දුන්නේ ය...

## අපනයන වලට සාපේක්ෂව ආනයන වැඩි වේගයකින් ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් වීම...




(a) August 2021 export and import data are preliminary unadjusted data from Sri Lanka Customs.

## පාස්කු ඉරු දින ප්‍රහාරයන්ගෙන් පසුව සංචාරක ක්ෂේත්‍රයේ ආදායම සීඝ්‍රයෙන් පහළ යෑම...




## අඛණ්ඩ ඉහළ ණය සේවාකරණය සමග දළ නිල සංචිත පහළ යෑම...




## ශ්‍රී ලංකාව අභියෝග රැසක් මධ්‍යයේ වුව ද, ණය සේවාකරණ ගෙවීම් අඛණ්ඩව සිදු කරගෙන ගියේය...



# කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ පුනරාවර්තන වියදම් ඉහළ යෑම සහ ආදායම පහත වැටීම හේතුවෙන් අයවැය හිඟය නාමික වශයෙන් ඉහළ ගොස් ඇත...

## රාජ්‍ය ආදායම




## ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ




## රාජ්‍ය වියදම




## මධ්‍යම රජයේ ණය



# සමස්තයක් ලෙස උද්ධමනය පහළ මට්ටමක පැවතිය ද, මුදල් සහ ණය සැපයුමෙහි සැලකිය යුතු ඉහළ යාමක් නිරීක්ෂණය කරන ලදී...

## පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා දායකත්වය




## පෞද්ගලික අංශය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ලබා දුන් ණය




## රජය වෙත ලබා දුන් ශුද්ධ ණය - වාර්ෂික ඉහළ යෑම




## මතුපිට හා මූලික උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය) කොළඹ පාරිභෝගික මිල දර්ශකය



# සංඛ්‍යාත්මකව බැලූ විට වසංගත තත්ත්වය සඳහා රජය සහ මහ බැංකුව විසින් දැක්වූ ප්‍රතිචාරයන් ඉතා ඉහළ මට්ටමක වූ අතර ඇතැම් විට ඊට නිසි පිළිගැනීමක් නොලැබුණි...

## රජයේ සහාය*

- සක්‍රීය එන්නත්කරණ වැඩසටහන්
- ආර්ථික පිළිසරණක් අවශ්‍ය පවුල් සඳහා රාජ්‍ය මූල්‍ය උත්තේජනය සහ මූල්‍ය ආධාර
- සංචරණ සීමා සහ ඒ ආශ්‍රිත පාලන ක්‍රියාමාර්ග
- වෛද්‍ය උපකරණ බදුවලින් නිදහස් කිරීම්
- පී.සී.ආර්. සහ ප්‍රතිදේහජනක පරීක්ෂණ
- සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීම
- මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්

රුපියල් බිලියන **209**

*2020 වසර තුළ සහ 2021 සැප්තැම්බර් 07 දක්වා රජයේ සහාය ඇතුළත් වේ

## ශ්‍රී ලංකා මහ බැංකුවේ සහාය

| | |
|---|---|
| සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ප්‍රතිමූල්‍ය ණය පහසුකම | රුපියල් බිලියන **165.5** (දළ.දේ.නි යේ % ලෙස 1.1ක්) |
| රජය සඳහා මූල්‍ය ආධාර** | රුපියල් බිලියන **2,002** (දළ.දේ.නි යේ % ලෙස 13.4ක්) |
| පොලී පිරිවැය අඩු කිරීම හරහා පෞද්ගලික අංශය වෙත වූ ඉතිරිකිරීම්*** | රුපියල් බිලියන **365** (දළ.දේ.නි යේ % ලෙස 2.4ක්) |
| පොලී පිරිවැය අඩු කිරීම හරහා රාජ්‍ය අංශය තුළ සිදු වූ ඉතිරිකිරීම්*** | රුපියල් බිලියන **313** (දළ.දේ.නි යේ % ලෙස 2.1ක්) |
| ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග | ණය ආපසු ගෙවීමේ සහන කාල සීමාව දීර්ඝ කිරීම**** ගෙවිය යුතු ප්‍රාග්ධනය (බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන) රුපියල් බිලියන **780** |

** 2020 වසර තුළ දී සහ 2021 වසරේ සැප්තැම්බර් 24 දක්වා සපයන ලද සහාය
***2020 වසර තුළ දී සහ 2021 වසරේ ජූලි අවසානය දක්වා ඉතුරුම්
****එකම ණය ගැනුම්කරු විවිධ යෝජනා ක්‍රම යටතේ සහන ලබාගෙන තිබිය හැක

# ඇත්ත වශයෙන්ම, එන්නත්කරණ ක්‍රියාවලියෙහි සීඝ්‍ර ප්‍රගතිය සහ ගෝලීය සංචරණ සීමා ක්‍රමයෙන් ඉවත් කිරීම වඩා යහපත් අනාගත අපේක්ෂාවන් සඳහා බලාපොරොත්තු ඇති කරවයි...

- කොවිඩ් -19 රෝගීන් සංඛ්‍යාව සහ රෝහල්ගත වීමේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් පහත වැටීම මගින් එන්නත්කරණ ක්‍රියාවලිය සීඝ්‍රයෙන් සිදු කිරීමේ ප්‍රතිලාභ ජනිත වීම ආරම්භ වී ඇත

**ශ්‍රී ලංකාව තුළ: (2021 සැප්. 30 දිනට)**

අවුරුදු 20ට වැඩි ජනගහනයෙන් 97.9%කට අවම වශයෙන් එක් මාත්‍රාවක් හෝ ලැබුණි

අවුරුදු 20ට වැඩි ජනගහනයෙන් 79.1%ක් එන්නත් දෙකම ලබා ඇත

මුළු ජනගහනයෙන් 53.5%ක් පූර්ණ වශයෙන් එන්නත්කරණයට ලක්ව ඇත

**ගෝලීය වශයෙන්: (2021 සැප්. 28 දිනට)**

ජනගහනයෙන් 44.9%කට අවම වශයෙන් එක් මාත්‍රාවක් හෝ ලැබුණි

මුළු ජනගහනයෙන් 33.0%ක් පූර්ණ වශයෙන් එන්නත්කරණයට ලක්ව ඇත

## දෛනිකව වාර්තා වන කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව සහ මරණ සංඛ්‍යාව




*Source :* Ministry of Health

## ජනගහනයෙන් කොවිඩ්-19 එන්නත් ලබා ගත් ප්‍රතිශතය (2021 සැප්තැම්බර් 28 දිනට)




*Source :* Ourworldindata.org

# අතීතයේ දී පවා අප විශාල අභියෝගවලට මුහුණ දී ඇත...

- **1505 සිට 1948 දක්වා වසර 443ක විදේශීය පාලන කාලයක්**
- **දශක තුනක් පුරා පැවතුණු අභ්‍යන්තර ගැටුම් සහ දෙවරක් මතු වූ කැරලි කෝලාහල**
- **වරින් වර ඇතිවන විදුලිබල සහ බලශක්ති අර්බුද**
  - විදුලි කප්පාදු කිරීම
  - ඉන්ධන අර්බුද (ඉන්ධන පිරිපහදු වසා දැමීම, බාල ඉන්ධන ආනයනය)
- **දැඩි නියං, බරපතල ගංවතුර තත්ත්වයන් සහ ස්වාභාවික විපත් (සුනාමිය ඇතුළුව)**
- **ගෝලීය වසංගත**
- **2009 වසරට පෙර පැවති ඉලක්කම් දෙකක මට්ටමේ උද්ධමනය සහ ඒ හේතුවෙන් අවශ්‍ය වූ ඉහළ වෙළඳපොළ පොලී අනුපාතික**
- **විදේශ විනිමය සංචිත ක්ෂය වීම**
- **විදේශීය අංශයේ අසමතුලිතතා සහ විදේශ විනිමය පාලනය කිරීම්: ශ්‍රේණිගත කිරීම් පහත වැටීම**
- **ණය මට්ටම් ද.දේ.නි.යෙන් 100%ට වඩා ඉක්මවා දිගු කාලයක් පැවතීම**

**නමුත්, ජාතියක් වශයෙන් අපි සැමවිට ජය ගත්තෙමු**



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මෙවන් පසුබිමක දී, මෙම අභියෝගවලට තිරසාරව මුහුණ දීම සඳහා සියලු පාර්ශ්වකරුවන්ට ඔවුන්ගෙන් අපේක්ෂිත කාර්යභාරය පිළිබඳව අප දැන් පැහැදිලි කිරීමක් සිදු කළ යුතුය...



# ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සහ සාර්ව ආර්ථික ස්ථායීතාව ලබා ගැනීම සඳහා කාල රාමු ත්‍රිත්වයකින් යුතු සැලැස්මක් යෝජනා කෙරේ ...

#1

- **2021 ඔක්තෝබර් 01 සිට 2022 මාර්තු 31 දක්වා මාස හයක කාලසීමාව සඳහා ඉදිරි දැක්ම**
  - සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සඳහා වූ ඉලක්කගත ප්‍රයත්න
  - නිසි කලට ණය සේවාකරණය අඛණ්ඩව සිදු කර ගෙන යෑම සහතික කිරීමට කෙටි කාලීන ක්‍රියාමාර්ග ගැනීම
  - වෙළඳපොළ තුළ විදේශීය මුදල් ද්‍රවශීලතාව ඉහළ නැංවීම
  - වසංගත බලපෑමෙන් යථා තත්ත්වයට පත් වීම සඳහා සියළුම ව්‍යවසායයන් සඳහා රාමුවක් සැකසීම

#2

- **2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා වසරක කාල සීමාව**
  *(2022 ජනවාරි 04 වන දින ඉදිරිපත් කරනු ලැබේ)*
  - ණය නොවන මුදල් ප්‍රවාහ කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙමින් විදේශීය ණය ව්‍යුහය වැඩි දියුණු කිරීම
  - රාජ්‍ය මූල්‍ය සහ විදේශ අංශයේ ඉලක්ක ළඟා කරගැනීම
  - මූර්ත ආර්ථිකයේ වේගවත් යථා තත්ත්වයට පත්වීමක් ප්‍රවර්ධනය කිරීම
  - ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් සහ ව්‍යාපාරයක් කරගෙන යාමේ පහසුව පිළිබඳ දර්ශක වැඩි දියුණු කිරීම

#3

- **මැදි කාලයේ සිට දිගු කාලය දක්වා**
  - ඕනෑම කම්පනයකට ඔරොත්තු දීම සඳහා සියලුම සාර්ව මූලිකාංගවලට අදාළ ස්ථාවර තත්ත්වයක් ගොඩනැගීම
  - දේශීය නිෂ්පාදන ආර්ථිකය ශක්තිමත් කිරීම
  - අඩු උද්ධමන පරිසරයක් තුළ වඩා ඉහළ වර්ධනයක් ලබා ගැනීම
  - රාජ්‍ය මූල්‍ය සහ මුදල් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම

# කෙටි කාලීනව, එනම් මීළඟ මාස හය පිළිබඳව, සමීපව අවධානය යොමු කරමින් විදේශ අංශයේ ස්ථායීතාව තහවුරු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කඩිනම් පියවර ගනු ඇත...

- විදේශ විනිමය අභියෝගය සහ ණය සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන, මෙම කාලපරිච්ඡේදය නිසි ලෙස කළමනාකරණය කිරීමෙන් ආර්ථිකය නැවත නගාසිටුවීමට හැකි වන පරිදි පැහැදිලි බව සහ නිශ්චිතභාවය ඇති කිරීම මෙලෙස කෙටිකාලීන වශයෙන් අවධානය යොමු කිරීම සඳහා මූලික හේතුව වේ
- එම මාස 6ක කාල සීමාව අවසන් වන විට, වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම සඳහා දැනට ගෙන ඇති ප්‍රයත්නයන් සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරනු ඇති අතර, සංචාරක අංශයෙන් ලැබෙන මුදල් ප්‍රවාහ යථා තත්ත්වයට පත් වීමට ද ඉඩ ඇත
- වරාය නගරය සහ කාර්මික කලාප ආරම්භ වීමත් සමඟ සෘජු විදේශ ආයෝජන ගලා ඒම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ

**මෙමගින්, ඉලක්කගත මාස හයක කාලය අවසාන වන විට විදේශීය අංශය සඳහා වඩාත් යහපත් පදනමක් සැපයෙනු ඇත**

## මෙම නව ප්‍රයත්නය සඳහා සෑම පාර්ශ්වකරුවෙකුගේම වැදගත්,එහෙත් මධ්‍යස්ථ දායකත්වය සමඟ විදේශීය අංශයේ සියලු පාර්ශ්වයන්ගේ ඒකාබද්ධ උත්සාහය අවශ්‍ය වනු ඇත...

- රජය සහ මහ බැංකුව විසින් සපයන ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ මගින් ආර්ථිකය වඩාත් ස්ථාවර මට්ටමකට පරිවර්තනය වන කාල පරිච්ඡේදය තුළ අවශ්‍ය වන හැඩ ගැසීම් ක්‍රමානුකූලව සිදුකර ගැනීම සඳහා සහාය සැලසෙනු ඇත
- මෙම උත්සාහයන් ජාත්‍යන්තර ආයෝජකයන්ගේ සහ ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනයන්හි ධනාත්මක ක්‍රියාකලාපයන් ඇතිවීම සඳහා ද බලපානු ඇත. ගෝලීය මහ බැංකුවල ක්‍රියාකලාපයන් ද ඉදිරි ගමන්මග කෙරෙහි බලපානු ඇත

**එක් අංශයක් වෙත පමණක් මෙහි වගකීම නොපැවරෙන නමුත් සෑම අංශයක් ම මේ සඳහා දායක විය යුතුය**

## ප්‍රධාන පාර්ශ්වකරුවන්ගෙන් අපේක්ෂා කෙරෙන ප්‍රමුඛ ප්‍රතිඵල මාලාව:

**රජය:** ව්‍යාපාර-හිතකාමී අයවැයක්; ණය නොවන මුදල් ප්‍රවාහයන්හි වර්ධනයක්; රාජ්‍ය ණය සම්මිශ්‍රණය වෙනස් කිරීම සඳහා අරමුදල් රැස් කිරීමට ලබා දෙන සක්‍රිය සහාය

**මහ බැංකුව:** මුදල් නීති පනත තුළ නියම කර ඇති පරිදි සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම; ස්ථාවර විනිමය අනුපාතයක් සහ පොලී අනුපාතික ව්‍යුහයක් තහවුරු කිරීම

**බැංකු අංශය:** දේශීය විදේශ විනිමය හුවමාරු ගනුදෙනුවල දී වඩාත් ඉහළ විනිවිදභාවයකින් කටයුතු කිරීම; විදේශයන්ගෙන් නව අරමුදල් සහ ණය ලබා ගැනීම් ඉහළ නැංවීම; අපනයන ඉපැයීම් පරිවර්තනය කිරීම තහවුරු කිරීමට මහ බැංකුව සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කිරීම

**වෙළෙඳ භාණ්ඩ සහ සේවා අපනයනකරුවන්:** විනිමය අනුපාතිකය පිළිබඳ අහිතකර සමපේක්ෂණයෙන් වැළකීම සහ අපනයන ඉපැයීම් මෙරටට ගෙන්වා ගැනීම සහ නිසි කලට ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීම; අපනයන ව්‍යාපාර වර්ධනය කිරීම

**ආනයනකරුවන්:** අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන ආනයන නැවැත්වීම

**සිල්ලර වෙළඳුන් සහ තොග වෙළඳුන්:** අත්‍යවශ්‍ය ආනයනික භාණ්ඩ සහ දේශීය භාණ්ඩ තොග සඟවා තබා ගැනීමෙන් වැළකීම; මිල ඉහළ නැංවීමෙන් අධි - අසාමාන්‍ය ලාභ ඉපැයීමට උත්සාහ ගැනීමෙන් වැළකීම සහ අසාමාන්‍ය ලෙස ඉහළ මිල ගණන් අයකිරීමෙන් වැළකීම

**ගෝලීය ශ්‍රී ලාංකිකයන්:** ප්‍රේෂණ සහ ණය නොවන මුදල් ප්‍රවාහ ඉහළ නැංවීම

# රාජ්‍ය ණය ආශ්‍රිත ප්‍රධාන ගැටලු සඳහා පැහැදිලි ප්‍රත්පතිමය ප්‍රතිචාර අවශ්‍ය වනු ඇත...

- වසංගතය මධ්‍යයේ රාජ්‍ය මූල්‍ය කටයුතු මත එල්ල වන සැලකිය යුතු පීඩනය
- වසර ගණනාවක් පුරා විදේශීය ණය එක් රැස් වීම මගින් තිරසාරාත්මකභාවය සම්බන්ධ ගැටලු පැන නැඟී ඇත
- 2018 අප්‍රේල් සිට 2019 ජූනි (මාස 15) දක්වා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මගින් ලබාගත් ණය එ. ජ. ඩො. බිලි. 6.9ක පමණ විශාල මුදලකි
- කොවිඩ් - 19 වසංගතය සංචාරක ව්‍යාපාරය, ආයෝජන ගලා ඒම්, අනෙකුත් විදේශ විනිමය ඉපැයුම් සහ ගලා ඒම් වෙත බලපෑම් එල්ල කළේය
- ණය ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම සහ අහිතකර සමපේක්ෂණය මගින් සාම්ප්‍රදායික මූල්‍යනය කරා පවතින පිවිසුමට බලපෑම් එල්ල වුණි
- වසංගත කාලයේ සිට එ. ජ. ඩො. බිලි. 2ක අගයකින් යුත් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් සාර්ථකව ගෙවා දැමීමත් සමඟ ණය සේවාකරණ හැකියාව සම්බන්ධව විශ්වාසය යළි පිහිටුවනු ලැබිණි

## නොපියවූ මධ්‍යම රජයේ ණය ශේෂ (වසර අවසානයට)




- නිසි කලට ණය ගෙවන බවට නැවත සහතික කිරීමත්, නිදහසෙන් පසු වසර 70ක කාලයක් පුරා දේශය තැබූ නිකැළැල් ණය සේවාකරණ වාර්තාව පිළිබඳත් ණය දෙන්නන් පූර්ණ දැනුවත්භාවයකින් පසු වේ
- ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ද්විතීයික වෙළෙඳපොළෙහි ඉහළ ඵලදාවක් පැවතිය ද, පවතින ප්‍රමාණයන් අවම වීම

## ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම්






ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# බැංකු අංශය ශක්තිමත්ව පවතින නමුත් ගැටලු කිහිපයක් සමඟ කටයුතු කිරීමට සිදුවේ...

- විදේශ මුදල් ද්‍රවශීලතාව මත වන පීඩනය
- වසංගතයෙන් බලපෑමට ලක් වූ ණයගැතියන් සඳහා ණය ආපසු ගෙවීමේ සහන කාලය දීර්ඝ කිරීම සහ වසංගතයෙන් පසු ආර්ථිකය තිරසාර ලෙස යථා තත්ත්වයට පත් කිරීමේ දී ඇති විය හැකි ගැටලු
- බලපත්‍රලාභී බැංකු මගින් රජය සහ රජය සතු ව්‍යාපාර ව්‍යවසායයන් වෙත ලබාදුන් ණය තොගය ඉහළ යෑම
- තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂාව ඇතුළුව මෙහෙයුම් කටයුතුවල ඔරොත්තු දීමේ හැකියාව සඳහා ඇති විය හැකි බාධා

## ප්‍රාග්ධනය




## ලාභදායීත්වය




## ද්‍රවශීලතාව




## වත්කම්වල ගුණාත්මකභාවය




| අයිතමය | අවසානයේ දී පවතින ප්‍රමාණය (රුපියල් ට්‍රිලියන) | | වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (%) | |
|---|---|---|---|---|
| | 20 දෙසැ. | 21 අගෝ. | 20 දෙසැ. | 21 අගෝ. |
| වත්කම් | 14.7 | 16.4 | 17.1 | 18.9 |
| ණය | 9.1 | 10.4 | 11.9 | 18.0 |
| ආයෝජන | 4.2 | 4.5 | 21.7 | 23.8 |
| තැන්පතු | 11.1 | 12.5 | 21.6 | 20.6 |
| විදේශ ණය | 1.7 | 2.0 | 0.8 | 13.9 |
| ප්‍රාග්ධන අරමුදල් | 1.3 | 1.4 | 11.0 | 16.2 |

# පසුගිය වසර කිහිපය තුළ දී තීව්‍ර වූ අභියෝග කිහිපයකට බැංකු නොවන අංශයට මුහුණ දීමට සිදු විය...

- ඒකාබද්ධ කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම තරමක් මන්දගාමී වීම
- කඩා වැටුණු මූල්‍ය සමාගම්හි තැන්පත්කරුවන්ගේ ගැටලු විසඳිය යුතුව ඇත
- අසාර්ථක මූල්‍ය සමාගම් නැවත ගොඩ නැගීම පිළිබඳ සලකා බැලිය යුතුය
- බැංකු නොවන මූල්‍ය ආයතනවල පාරිභෝගිකයින් සඳහා අඛණ්ඩව සහන ලබා දිය යුතු අතර, බැංකු නොවන මූල්‍ය ආයතනවලට අදාළ ආයතන මගින් සහාය ලබා දීමට සිදු වීම
- බැංකු නොවන අංශයේ ව්‍යුහාත්මක සහ ව්‍යාපාරික ආකෘතියේ ගැටලු විසඳීම සඳහා ශක්තිමත් නියාමන රාමුවක් ස්ථාපිත කිරීමට නියමිතය

**බැංකු නොවන මූල්‍ය අංශයේ වත්කම්, ණය ලබාදීම්, තැන්පතු සහ ණය ලබාගැනීම්**




Note: Figures for end of Financial Year

**බැංකු නොවන මූල්‍ය අංශයේ වත්කම් මත ප්‍රතිලාභය, හිමිකම් මත ප්‍රතිලාභය, සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මක සහ අක්‍රීය ණය අනුපාත**



# අපනයනකරුවන් සම්බන්ධයෙන් සැලකීමේ දී, භාණ්ඩ ප්‍රවාහය හා අනුරූපීව මුදල් ගලා ඒමක් දක්නට නොලැබිණි...

- අපනයන භාණ්ඩ ප්‍රවාහය සහ මුදල් ගලා ඒමේ ප්‍රවාහය අතර පුළුල් පරතරයක් පවතී
- විනිමය අනුපාත වෙනස්වීම් පිළිබඳ අනිසි සමපේක්ෂණ හේතුවෙන්, අපනයන ආදායම ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ මැලි කමක් ඇති බව දක්නට ලැබුණු අතර, ඒ හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත වූ මුදල් ගලා ඒම සීමා විය
- පොලී අනුපාත පරතරය වාසිදායක ලෙස යොදා ගනිමින් අපනයනකරුවන් සිය ඉපැයීම් මෙරටට ගෙන්වා ගැනීම/ ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීම ප්‍රමාණවත් නොවූ හෙයින් අපනයන අංශය ද ඇතුළත්ව සමස්ත ආර්ථිකය සඳහා සහාය වීමට රජය විසින් ගත් ප්‍රයත්නයන්ට බාධා ඇති විය

- අපනයන කටයුතු ඔස්සේ ජනනය වන විදේශ විනිමය මෙරටට නිසි අයුරින් ගෙන්වා ගැනීම සහ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම තහවුරු කිරීම අත්‍යවශ්‍ය වේ

**මාසික අපනයන ආදායම**




**මුදල් ප්‍රවාහය**

අපනයන ඉපැයීම් මෙරටට ගෙන්වා ගැනීමේ සාමාන්‍ය මාසික අගය එ.ජ. ඩොලර් මිලියන 640ක් වේ.

**භාණ්ඩ ප්‍රවාහය**

භාණ්ඩ අපනයනවල සාමාන්‍ය මාසික අගය එ.ජ. ඩොලර් මිලියන 985ක් වේ

අපනයන භාණ්ඩ ප්‍රවාහය සහ මුදල් ගලා ඒම අතර මාසික පරතරය එ.ජ. ඩොලර් මිලියන 345ක් වේ

**ජනවාරි සිට අගෝස්තු දක්වා අපනයන (2018-2021)(එ.ජ. ඩොලර් මිලියන)**




Note: August 2021 data are unadjusted and preliminary

# ආනයන සහ ආනයනකරුවන් සම්බන්ධයෙන් ද යම් පීඩන ඇතිවෙමින් පවතී...

- සමපේක්ෂණ ස්වභාවයේ ආනයන ඉහළ යමින් පවතී
- සමහර ආනයන පාලනයන් අඛණ්ඩව පැවතුන ද සමස්ත ඉන්ධන නොවන ආනයන වියදම ඉහළ ගොස් ඇත
- ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද අපනයන ඉපැයීම් (ඉපැයීම් රටට ගෙන්වා ගැනීම අසම්පූර්ණ තත්ත්වයක පවතින විට) සහ ආනයන වියදම අතර පරතරයේ සාමාන්‍ය මාසික අගය ඉතා අවදානම් සහගත මට්ටමක පවතී

## මාසික මුළු ආනයන වියදම




## මාසික ඉන්ධන නොවන මුළු ආනයන වියදම




## වෙළෙඳ හිඟය




## ආනයන දර්ශක –2021 ජනවාරි සිට ජුලි දක්වා




Note: August 2021 data are unadjusted and preliminary

# සේවා අපනයනකරුවන් (සංචාරක ඉපැයීම් හැර) කෙරෙහි වසංගතයෙන් ඇති වූ බලපෑම අඩු බව පිළිඹිබු වේ...

- වසංගතයෙන් සංචාරක ක්ෂේත්‍රයට බලපෑම් ඇති වුව ද , අනෙකුත් සේවා අපනයනය, විශේෂයෙන් තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම් (BPO) අංශය, වඩාත් හොඳ කාර්යසාධනයක් පෙන්වා ඇත

- ප්‍රවාහන අංශය වර්ධනය වීමේ සලකුණු පෙන්නුම් කරයි

- සේවා වෙළඳාමට අදාළව "අපනයන ආදායම" නැවත මෙරටට ගෙන්වා ගැනීම සඳහා අවශ්‍යතා දැනට පනවා නොමැත

තොරතුරු තාක්ෂණ -ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම් අංශය වෙත වූ ලැබීම්




වරාය සේවා - බහාලුම් හැසිරවීම




වරාය සේවා - භාණ්ඩ හැසිරවීම



# කර්මාන්තකරුවෝ ද අභියෝග රැසකට මුහුණ දුන්හ..

- විශේෂයෙන්ම නිෂ්පාදන අංශය ද ඇතුළත්ව, කර්මාන්ත අංශයේ විවිධාංගීකරණය සීමා විය
- කාර්මික අපනයනවල වර්ධනය සතුටුදායක මට්ටමක නොපැවතුණි

- දේශීය වෙළඳපොළ නිෂ්පාදනවල ආනයන අන්තර්ගතය බොහෝ විට ඉහළ අගයක් ගන්නා අතර, මෙය විශේෂ අවධානයක් යොමු කළ යුතු කරුණක් වේ






# සමාජ හා ආර්ථික කටයුතු සීමා කිරීමේ ක්‍රියාමාර්ග සහ සංචාරකයින්ගේ හිඟය හේතුවෙන් විදේශ විනිමය හුවමාරුකරුවන්ට බරපතල ගැටලු රැසකට මුහුණ දීමට සිදු විය...

- සංචාරකයන්ගේ පැමිණීම ඉතාම පහළ අගයක පැවතීම හේතුවෙන් බලයලත් මුදල් හුවමාරුකරන්නන්ගේ වාර්ෂික පිරිවැටුම් අවශ්‍යතාවට බලපෑම් එල්ල විය
- ඇතැම් බලයලත් මුදල් හුවමාරුකරන්නන්ගේ බලපත්‍ර ක්‍රියාකාරීත්වයක් නොමැති වීම හේතුවෙන් අවලංගු කර ඇත
- “සමාන්තර” විනිමය වෙළඳපොළ කටයුතු ඉහළ යෑම බැංකු පද්ධතියේ විදේශ විනිමය ද්‍රවශීලතාවට බාධා පමුණුවයි

- නිල විදේශ විනිමය අනුපාතික සහ “නිල නොවන විදේශ විනිමය වෙළඳපොළ” විනිමය අනුපාතික අතර සැලකිය යුතු වෙනසක් පැවතීම හේතුවෙන් නිල විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පහත යමින් පවතින අතර, නිල නොවන විදේශ විනිමය ප්‍රවාහ ඉහළ යන බවක් පිළිබිඹු වේ

- විදේශ රැකියා සඳහා පිටත්වීම් නැවත ආරම්භ කිරීමේ හදිසි අවශ්‍යතාවක් පවතී

## විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ




*Sources: Licensed Banks, Central Bank of Sri Lanka*

# අවිනිශ්චිතතාවයෙන් බලපෑමට ලක් වූ සිල්ලර වෙළඳුන් සහ තොග වෙළඳුන්ගේ ප්‍රතිචාර මෙම තත්ත්වය උග්‍ර කර ඇත...

- තොග වෙළඳුන් සහ සිල්ලර වෙළඳුන් විසින් භාණ්ඩ තොග රැස් කිරීම නිසා ආහාර බෙදා හැරීමේ අර්බුදයන් මතුව ඇති අතර, ඒ සඳහා රජයට දැඩි ප්‍රතිචාර දැක්වීමට සිදු විය
- විශේෂයෙන්ම අත්‍යවශ්‍ය ආහාර අයිතම සහ පාරිභෝගික භාණ්ඩ සඳහා තොග සහ සිල්ලර මිල අසාධාරණ ලෙස ඉහළ ගොස් ඇත
- කෙසේ වෙතත්, එවැනි වඩා ඉහළ පාරිභෝගික මිල ගණන්වලින් නිෂ්පාදකයන් ප්‍රතිලාභ ලබා නොමැත
- සංචරණ සීමා කාල තුළ දී කල්තබා ගත නොහැකි අයිතම අධික ලෙස අපතේ ගියේය

- මෙම කාරණා හේතුවෙන් වෙළඳපොළ තුළ මිල සීමා නියමයන් පැනවීමට සිදු වූ අතර, එමගින් වෙළඳපොළ යාන්ත්‍රණය වෙනස් වී ඇත.

**ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය**



# අනේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ විදේශ සේවා නියුක්තික ප්‍රේෂණ මිශ්‍ර කාර්යසාධනයක් වාර්තා කළේය...

- **2020 වසරේ ජූනි සිට 2021 වසරේ අප්‍රේල් දක්වා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඛණ්ඩව එ.ජ. ඩොලර් මිලියන 500කට වඩා වැඩි අගයක් මාසිකව වාර්තා කළ ද, පසුගිය මාස කිහිපයේ එහි කිසියම් අඩු වීමක් වාර්තා කරන ලදී.**
- **නිල සහ නිල නොවන මාර්ගවල විදේශ විනිමය අනුපාතික අතර පවතින පුළුල් විෂමතාව හේතුවෙන් විදේශ විනිමය උපයන්නන් නිල නොවන මාර්ග සඳහා යොමු වීම සහ විදේශ රැකියා සඳහා පිටත්වන සංඛ්‍යාව අඩුවීම මෙකී තත්ත්වය සඳහා බලපාන ප්‍රධාන හේතුවක් විය හැකිය**

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**




Sources: Licensed Banks, Central Bank of Sri Lanka

- **2021 අගෝස්තු : එ.ජ. ඩොලර් මිලියන 447 (-32.8%, වාර්ෂික ලක්ෂ්‍යමය)**
- **2021 (ජනවාරි-අගෝස්තු) : එ.ජ. ඩොලර් මිලියන 4,224 (-2.8%, වාර්ෂික ලක්ෂ්‍යමය)**
- **2020 (ජනවාරි-අගෝස්තු): එ.ජ. ඩොලර් මිලියන 4,346**
- **2020: විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සියයට 5.8%කින් ඉහළ ගියේය (වාර්ෂික ලක්ෂ්‍යමය)**

# විදේශීය සහභාගීත්වය අඩු වුවද, ශ්‍රී ලංකාවේ කොටස් හා සුරැකුම්පත් වෙළඳපොළ මනා ලෙස වර්ධනය විය...

- විදේශිකයන් කොටස් සහ රජයේ සුරැකුම්පත් මත ආයෝජනය කිරීමෙන් ක්‍රමයෙන් ඉවත් වී ඇත
- ණය ආපසු ගෙවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නොකැළැල් වාර්තාව නොසලකා, ශ්‍රේණිගත කිරීම් පහත හෙලීම හේතුවෙන් ඇති වූ ණය පැහැර හැරීම් පිළිබඳ අනවශ්‍ය භීතිය මෙම තත්ත්වය වඩාත් උග්‍ර කර ඇත
- ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම පිළිබඳ බිය ද මේ සඳහා හේතුවක් වී ඇත

- කෙසේ වෙතත්, දේශීය ආයෝජකයින්ගේ ඉහළ ආකර්ෂණය හේතුවෙන් කොළඹ කොටස් වෙළඳපොළ කලාපයේ හොඳම ක්‍රියාකාරී කොටස් වෙළඳපොළක් ලෙස පවතී
- නව විනිමය සුරැකුම්පත් පනත කොටස් වෙළඳපොළ වෙත ඇති කැමැත්ත නැවත ඇති කිරීමට හේතු වනු ඇත

**සියලු කොටස් මිල දර්ශකය (ASPI)**




Source: Colombo Stock Exchange

**රාජ්‍ය සුරැකුම්පත් සහ කොටස් වල විදේශීය දායකත්වය (එ. ජ. ඩොලර්)**

| | 2014 අවසානයට | 2021 සැප් අවසානයට |
|---|---|---|
| රාජ්‍ය සුරැකුම්පත් | මිලියන 3,489 | මිලියන 9 |
| කොටස් (CSE) | මිලියන 6,806 | මිලියන 3,970 |

**ප්‍රධාන කොටස් වෙළඳපොළ දර්ශකවල හැසිරීම - 2021**

| | YTD* (%) |
|---|---|
| ශ්‍රී ලංකාව (CSE) | +39.6% |
| ඉන්දියාව (Sensex) | +23.8% |
| එක්සත් ජනපදය (S&P 500) | +16.1% |
| ජර්මනිය (DAX) | +11.9% |
| ඔස්ට්‍රේලියාව (ASX 200) | +11.3% |
| ජපානය (Nikkei) | +7.3% |
| එක්සත් රාජධානිය (FTSE) | +10.4% |
| කොරියාව (KOSPI) | +6.8% |
| සිංගප්පූරුව (STI) | +8.5% |
| හොංකොං (HSI) | -9.8% |

*30 Sep 2021 Source: marketwatch

**රාජ්‍ය සුරැකුම්පත් හා කොළඹ කොටස් වෙළඳපොළ තුළ ශුද්ධ විදේශීය ආයෝජන ප්‍රමාණය (එ.ජ.ඩොලර් මිලියන)**



# පවතින දුෂ්කර ආර්ථික තත්ත්වයන් හමුවේ ශ්‍රී ලංකා මහ බැංකුව ද ස්ථායීතා අරමුණු ඉටු කරලීමේ දී අභියෝග රැසකට මුහුණ දෙන ලදී...

- විදේශ සංචිත පහළ යෑම
- විනිමය අනුපාතය මත වන පීඩනය
- මූල්‍ය උත්තේජනයන්ට සහාය වීමේ සහ මැදි කාලීනව ඇතිවිය හැකි උද්ධමන පීඩන වැළැක්වීම සඳහා කටයුතු කිරීමේ අවශ්‍යතාව
- මුදල් සම්ප්‍රේෂණ යාන්ත්‍රණයට ඇති බාධා

### දළ නිල සංචිත




### මෑත කාලීනව විනිමය අනුපාතයේ හැසිරීම




### ශ්‍රී ලංකා මහ බැංකුව සතු රාජ්‍ය සුරැකුම්පත් (මුහුණත අගය)




### භාණ්ඩාගාර බිල්පත් ඵලදා සහ නිත්‍ය අනුපාතික කොරිඩෝව




### නොපියවූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර




### මධ්‍යම රජයේ ණය මත විනිමය අනුපාතයේ බලපෑම



# රජයේ ඇතැම් ප්‍රතිපත්ති ප්‍රතිචාර මගින් සහයක් සැලසුණ ද , වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ජනතාව අභියෝගයන්ට මුහුණ දී ඇත...

- සමපේක්ෂණ ඉල්ලුම හේතුවෙන් ආනයනය ඉහළ ගොස් ඇත
- වෙනස් වීමට දක්වන විරෝධය (උදා: කාබනික පොහොර ප්‍රතිපත්තිය)
- පවතින සමාජීය සහ ආර්ථික කටයුතු සීමා කිරීම් සහ ජාත්‍යන්තර සංචාරක කටයුතු යථා තත්ත්වයට පත්වීමේ මන්දගාමීත්වය හේතුවෙන්, අවිධිමත් අංශයේ සේවකයින්, විශේෂයෙන් සංචාරක ක්ෂේත්‍රයේ නිරත වන්නන් දැඩි ලෙස බලපෑමට ලක්ව ඇත
- රට තුළට ගලා එන ප්‍රේෂණ අඩු වීම
- සමාජීය සහ ආර්ථික කටයුතු සීමා කිරීමේ බලපෑම
  - 2020: දින 66 ක කාලයක් දැඩි ලෙස සමාජීය සහ ආර්ථික කටයුතු සීමා කිරීම
  - 2021: දින 42 ක කාලයක් දැඩි නොවන ලෙස සමාජීය සහ ආර්ථික කටයුතු සීමා කිරීම

## ද.දේ.නි යේ අලාභය* (වාර්ෂික ලක්ෂ්‍යමය )




Source: Department of Census and Statistics

## සේවා වියුක්ති අනුපාතය සහ ශ්‍රම බලකායේ සහභාගිත්ව අනුපාතය




Source: Department of Census and Statistics

## සංචාරක ඉපැයීම්




Sources: SLTDA, Central Bank of Sri Lanka

## කොවිඩ්-19 ව්‍යාප්තියෙන් වූ බලපෑම අවම කිරීම සඳහා රජය විසින් වැය කළ වියදම




Source: Ministry of Finance



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

***කළ යුතු කාර්යයන් ලැයිස්තුවක*** **ස්වරූපයෙන් අද දින අප ඉදිරිපත් කරන රාමුව මගින් ශ්‍රී ලංකාවට ඉදිරි මාස හය සහ ඉන් පසු කාලයේ දී ඇති වන අභියෝගයන්ට මුහුණ දීමට සහාය සැලසෙනු ඇති...**

# කළ යුතු කාර්යයන් ලැයිස්තුව මගින් ප්‍රධාන අභියෝගවලට ප්‍රතිචාර දක්වනු ඇති අතර මෙයට ප්‍රධාන පාර්ශවකරුවන් ද ඇතුළත් වේ......

- රජය
- මහ බැංකුව
- බැංකු/බැංකු නොවන අංශය
- වෙළඳ භාණ්ඩ අපනයනකරුවන්
- සේවා අපනයනකරුවන්
- ආනයනකරුවන්
- කර්මාන්තකරුවන්/ දේපළ සංවර්ධනය කරන්නන්
- ණය ගැනුම්කරුවන්/ ඉතිරි කරන්නන්
- විදේශ විනිමය හුවමාරුකරුවන්
- මෙරටට මුදල් ප්‍රේෂණය කරන අනේවාසික ශ්‍රී ලාංකිකයන්
- කොටස් වෙළඳපොළ/ සාංගමික ණය වෙළඳපොල

## *කළ යුතු කාර්යයන් ලැයිස්තුව* මගින් ආර්ථික හා මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව කෙරෙහි තර්ජනයක් ඇති කෙරෙන තීරණාත්මක ගැටලු කෙරෙහි අවධානය යොමු කෙරේ...

### තීරණාත්මක ගැටලු

- ණය සහ විදේශ විනිමය සම්බන්ධ ගැටලු
- මූල්‍ය අංශයේ ගැටලු
- සාර්ව ආර්ථික ස්ථායීතාවට අදාළ ගැටලු

# තීරණාත්මක ගැටලු

**ණය සහ විදේශ විනිමය සම්බන්ධ ගැටලු**

මූල්‍ය අංශයේ ගැටලු

සාර්ව ආර්ථික ස්ථායීතාවට අදාළ ගැටලු

## ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම: රජය

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- ජනාධිපති කාර්යසාධක බලකාය හරහා විදේශ විනිමය ප්‍රවාහ (අපනයන සහ ආයෝජන) අධීක්ෂණය කිරීම (2021 ඉදිරි කාලය තුළදී මාසික සාමාන්‍ය අපනයන ඉපයීම් එ.ජ.ඩො. බිලි. 1.0කට වඩා ඉහළ නැංවීම ඉලක්ක කෙරේ) – (දැනට ක්‍රියාත්මක වේ)
- මූල්‍ය ලැබීම් ශක්තිමත් කිරීම සඳහා කෙටි කාලීනව සහ මධ්‍ය කාලීනව මූල්‍යනයන් ලබා ගැනීමට අදාළ රජයයන් සමඟ උසස් මට්ටමේ සාකච්ඡා සිදු කිරීම (කෙටි කාලීන ඉලක්කය: එ.ජ.ඩො. බිලි. 1.0; ඉදිරි තෙමස තුළ එ.ජ.ඩො. මිලි. 500) - (දැනට ක්‍රියාත්මක වේ)
- තෝරා ගත් උපායමාර්ගික නොවන සහ අඩුවෙන් භාවිතයට ගෙන ඇති වත්කම්වලින් මුදල් ඉපැයීම (ඉලක්කය: එ.ජ.ඩො. බිලි. 1.0ක්) - (දැනට ක්‍රියාත්මක වේ)
- වරාය නගරය සඳහා විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට වරාය නගර කොමිසමේ අතුරු නීති ප්‍රකාශනයට පත් කිරීම - (කළ යුතුව ඇත)
- නව විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ඖෂධ සහ අංශ කිහිපයක අනෙකුත් කර්මාන්ත සඳහා වෙන් කරන ලද කර්මාන්ත කලාප ප්‍රවර්ධනය කිරීම – (දැනට ක්‍රියාත්මක වේ)
- මූල්‍ය පනත ඔස්සේ බදු සමාව ක්‍රියාත්මක කිරීමෙන් මුදල් ගලා ඒම් සඳහා පහසුකම් සැලසීම (ඉලක්කය: එ.ජ.ඩො. මිලි. 100ක්) - (කළ යුතුව ඇත)
- වසර 1 ½ කින් කල් ඉක්ම වූ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ පදනම් වර්ෂය වෙනස් කිරීමේ ක්‍රියාවලිය (rebase) තවදුරටත් ප්‍රමාද නොකිරීමෙන් ආර්ථිකයේ සත්‍ය ධාරිතාව පිළිබිඹු කිරීම - (කළ යුතුව ඇත)
- සවිස්තරාත්මක මූල්‍යන ක්‍රමෝපායන් සමඟ ව්‍යාපාර හිතකාමී අයවැයක් ප්‍රකාශයට පත් කිරීම - (කළ යුතුව ඇත)

# ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම: රජය

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- අපනයනවල දේශීය අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීමට සුදුසු බදු ගැළපුම් හඳුන්වා දීම, අපනයන ඉපැයීම් රුපියල් වලට පරිවර්තනය කිරීම සහතික කිරීම; සහ මංගත සහ අවිධිමත් මාර්ග ඔස්සේ විදේශ විනිමය කාන්දු වීම් අධෛර්යමත් කිරීම - (කළ යුතුව ඇත)
- ආනයන ආදේශන දිරිගැන්වීම - (දැනට ක්‍රියාත්මක වේ)
- විදේශ මුදලින් රජයට අදාළ බදු ගෙවීම් සහිතව විදේශ විනිමය ඉපයීම් සහ සෘජු ආයෝජන යොදා ගනිමින් මෝටර් රථ ආනයනයට ඉඩ ලබා දීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දීම - (සලකා බැලීමට යෝජනා කරයි)
- සංචාරක කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා මුළු රටම වහාම සූදානම් කිරීම - (දැනට ක්‍රියාත්මක වේ)
- විදේශගත ශ්‍රමිකයින් විසින් ප්‍රේෂණය කරනු ලබන සහ පරිවර්තනය කරන එ.ජ.ඩොලරයක් සඳහා අතිරේකව රුපියල් 2ක් ගෙවීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම - (දැනට ක්‍රියාත්මක වේ)
- විශේෂ තැන්පතු ගිණුම් (SDA) සඳහා අමතර පොලියක් ගෙවීම අඛණ්ඩව සිදු කරගෙන යාම - (දැනට ක්‍රියාත්මක වේ)

## ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම: මහ බැංකුව

### කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- ඉන්ධන වියදම සඳහා වැයවෙන මුදලෙන් කොටසක් මූල්‍යනය සඳහා වෙළඳපොළ වෙත විදේශ විනිමය ද්‍රවශීලතාව සැපයීම - (දැනට ක්‍රියාත්මක වේ)
- විදේශ රටවල් සමග කෙටි කාලීන විනිමය හුවමාරු පහසුකම් සඳහා එළඹීමට සාකච්ඡා කිරීම (ඉලක්කය : එ. ජ. ඩො. බිලි. 1.5) - (දැනට ක්‍රියාත්මක වේ)
- රජයන් අතර විදේශ විනිමය ගලා ඒම සඳහා පහසුකම් සැලසීම - (දැනට ක්‍රියාත්මක වේ)
- 2024 වනවිට ද.දේ.නි. යෙන් 10% ලෙස ජාත්‍යන්තර බැඳුම්කර වගකීම අඩුකර ගැනීමට කටයුතු කිරීම සහ ඉන් අනතුරුව එය එම මට්ටමේ පවත්වාගෙන යෑම - (දැනට ක්‍රියාත්මක වේ)
- ණය නොවන විදේශ විනිමය ලැබීම් සඳහා පහසුකම් සැලසීම - (දැනට ක්‍රියාත්මක වේ)
- අවසර ලබා දී ඇති හර කිරීම් වලින් පසුව අපනයන ඉපයීම් පරිවර්තනය කිරීම සඳහා අපනයනකරුවන්ට විධාන නිකුත් කිරීම (ආසන්න වශයෙන් මාසිකව එ. ජ. ඩො. බිලි. 0.5 විදේශ විනිමය ලැබීමක්) - (දැනට ක්‍රියාත්මක වේ)
- 2020 වසරේ සිට රැස් කරගෙන ඇති අපනයන ඉපයීම් ඉදිරි මාස 6 තුළදී කොටස් වශයෙන් පරිවර්තනය කිරීම සඳහා අපනයනකරුවන්ට විධාන නිකුත් කිරීම (ආසන්න වශයෙන් මාසිකව එ. ජ. ඩො. බිලි. 0.3) - (දැනට ක්‍රියාත්මක වේ)

# ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම: මහ බැංකුව

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- විදේශ විනිමය ලැබීම් අධීක්ෂණය කිරීමට සහ විදේශ විනිමය ඉපයීම් ආපසු ගෙන්වා ගැනීම හා පරිවර්තනයට අදාළව අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පද්ධති ස්ථාපනය කිරීම - (දැනට ක්‍රියාත්මක වේ)
- රාජ්‍ය සුරැකුම්පත් වෙත විදේශ ආයෝජන ආකාර්ෂණය කර ගැනීම සඳහා උත්සාහ දැරීම (ඉලක්කය : එ. ජ. ඩො. බිලියන 1.0) - (දැනට ක්‍රියාත්මක වේ)
- ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජක පදනම විවිධාංගීකරණය කිරීම සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා විදේශ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට කටයුතු කිරීම - ඉදිරි මාස 6 දී සංවර්ධන බැඳුම්කර මුළුමනින්ම නැවත නිකුත් කිරීම - (කළ යුතුව ඇත )
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රාජ්‍ය සුරැකුම්පත් මිලදී ගැනීම ක්‍රමයෙන් අවම කිරීම - (කළ යුතුව ඇත )
- ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට පහසුකම් සැලසීම - (කළ යුතුව ඇත )
- මූර්ත සඵල විනිමය අනුපාතය සලකා බලමින්,ඉදිරි මාස 03 තුළදී එ. ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල රුපි. 199 සිට රුපි. 203 දක්වා මට්ටමේ තරඟකාරීව පවත්වාගෙන යාම සහ ඉන් අනතුරුව එය සමාලෝචනය කිරීම -(දැනට ක්‍රියාත්මක වේ)

*...මින් සමහරක් ඉදිරි පිටු වලදී විස්තරාත්මකව විග්‍රහ කෙරෙනු ඇත*

# මූල්‍ය ප්‍රවාහයන් වඩාත් සමීපව නිරීක්ෂණය කිරීම තහවුරු කිරීම සඳහා නිසි ක්‍රමවේදයන් සකස් කෙරෙමින් පවතී ...

- බැංකු අංශයේ විදේශ විනිමය ගලා ඒම් සහ පිටතට ගලා යෑම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීමේ අවශ්‍යතාව හඳුනාගත් මහ බැංකුව ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියක් (ITRS) දැනටමත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබේ
    - ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මගින් විවිධ අපනයනාභිමුඛ අංශවල ක්‍රියාකාරිත්වය සහ එම අපනයන ආදායම ආපසු ගෙන්වා ගැනීම පිළිබඳව තොරතුරු නිරීක්ෂණය කරයි
    - විදේශීය අංශයට අදාළ පූර්ව දැනුම්වත් තීරණ ගැනීමට හැකි වන පරිදි වඩා හොඳ දත්ත ලබා දීමට ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මගින් බලාපොරොත්තු වේ
    - එම පද්ධතිය 2022 වසරේ ජනවාරි 01 වැනි දින සිට බලාත්මක කරනු ඇත

**යෝජිත ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය සහ අපේක්ෂිත ප්‍රතිඵල**



# රජයේ සුරැකුම්පත් වෙත විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට දරන උත්සාහයන් වේගවත් කෙරෙනු ඇත...

- භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර සඳහා වන ආයෝජන සඳහා දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය අතරමැදියන් සම්බන්ධ කර ගැනීම සඳහා වූ ඒකාබද්ධ ප්‍රයත්න අනුගමනය කෙරේ
- ආකර්ෂණීය ප්‍රතිලාභ සහ මහ බැංකුව සමග විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වල යෙදීමට හැකිවීමත් හරහා විදේශ විනිමය අවදානම ඉවත් වීම (zero cost SWAPs) හේතුවෙන් නුදුරු කාලයේදී නව ආයෝජන සඳහා පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ
- ද්විතීයික වෙළෙඳපොළ වෙත ප්‍රවේශය සහ/හෝ පවතින එළදා අනුපාතික යටතේ සැලකිය යුතු ප්‍රමාණයක ඍජු නිකුත් කිරීමේ ක්‍රියාමාර්ග හරහා ප්‍රවේශය වීමේ හැකියාව ඇති කරයි
- මැදපෙරදිග සහ ආසියානු කලාපය සමඟ කලාප තුළ ඍජු රැස්වීම් පැවැත්වීම හරහා ශ්‍රී ලංකාවේ ඇති ආයෝජන අවස්ථා පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රයත්න 2021 වසරේ ඔක්තෝම්බර් මාසය ආරම්භයේදී සිදු වේ
- මංගත රැස්වීම් සහ යුරෝපය හා එක්සත් ජනපදය සමඟ පැවැත්විය හැකි ඍජු හමුවීම් ද පැවැත්වීමට අපේක්ෂා කෙරේ

# ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙත විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා එම බැඳුම්කරයන්හි ආයෝජක පදනම විවිධාංගීකරණය කෙරේ...

## ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමේ මෑත කාලීන දත්ත...

- එ. ජ. ඩො. මිලි. 1,002.4ක් වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඉදිරි මාස හය තුළදී පරිණත වනු ඇත
- ඉදිරි මාස හය තුළදී කල් පිරෙන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් 88.9% ක් දේශීය බැංකු විසින් දරනු ලබයි
- දේශීය බැංකු අංශයේ ආයෝජන මත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කේන්ද්‍රීය වීම
- මෑත කාලීන නිකුතුවලදී සාංගමික අංශයේ ආයෝජක කැමැත්තෙහි ක්‍රමානුකූල වැඩිවීමක් දක්නට ලැබිණි
- මෑත කාලීන නිකුතුවල සාමාන්‍ය කල්පිරීමේ කාලය (ATM) කෙටි කාලීන කල් පිරීම් වෙත වඩාත් නැඹුරු වී ඇත
- ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජකයින්ගේ මනාපය ස්ථාවර පොලී අනුපාතයක් සඳහා බව පෙන්නුම් කෙරේ

## ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන සම්බන්ධයෙන් වහා අවධානය යොමු කළ යුතු කරුණු...

- මැදපෙරදිග, ආසියාව සහ ලෝකයේ සෙසු රටවල්හි රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයෝජකයින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය සඳහා ආකර්ෂණය කර ගැනීම
- කේන්ද්‍රිත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජක පදනම විවිධාංගීකරණය කිරීම
- ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර එ .ජ.ඩො.මිලි. 50 සිට කාණ්ඩ ලෙස නිකුත් කිරීමට සහ සහ එ .ජ.ඩො.මිලි. 50 ක ගුණයකින් යුත් කාණ්ඩ ලෙස අලෙවි කිරීම
- දැනට ආයෝජකයින් සතුව පවතින ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කල් පිරීමට පෙර ආයෝජකයින්ට සෘජුවම නව බැඳුම්කර පිරිනැමීම
- මෑත කාලීන ප්‍රාථමික වෙන්දේසි වලදී පිරිනැමූ එලදා සහ වෙළෙඳපොළ තත්ත්වයන්ට අනුකූලව එලදා අනුපාතික සහ කල් පිරීම් තීරණය කිරීමට නියමිතය

**<u>අපේක්ෂිත ප්‍රතිඵලය</u>; ඉදිරි මාස හය තුළ ආසන්න වශයෙන් අතිරේක එ. ජ. ඩො. මිලි. 300ක් රැස් කර ගැනීම**

**ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙනුවෙන් ණය සේවා ගෙවීම් (එ. ජ. ඩො. මිලි.)**

| කාලය | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආපසු ගෙවීම | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පොලී ගෙවීම් |
|---|---|---|
| ඔක්. 2021 සිට මාර්තු 2022 | 1,002.4 | 65.5 |
| 2022 | 1,404.8 | 98.7 |
| 2023 | 606.7 | 34.9 |
| 2024 | 206.1 | 10.1 |
| 2025 | 20.9 | 1.2 |
| 2026 | 6.9 | 0.5 |

# දේශීය වෙළඳපොළ තුළ මූලයකරණ ප්‍රයත්න වෙළඳපොළ ප්‍රවණතා සමග අනුකූල කරනු ලබන අතර, වසරක් තුළ දී ණය කල් පිරීම් ක්‍රමයෙන් අඩු කෙරෙනු ඇත...




- ප්‍රධාන වශයෙන් වසංගත තත්ත්වය සහ රජයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩාගාර බිල්පත් මත රඳාපැවතීම හේතුවෙන් කෙටිකාලීන ණය ඉහළ ගියේය
- නුදුරේදී, කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් වලින් කොටසක් භාණ්ඩාගාර බැඳුම්කර බවට පත් කිරීමට ඇති හැකියාව සොයා බලනු ලැබේ
- භාණ්ඩාගාර බැඳුම්කර සෘජුවම නිකුත් කිරීමේ කවුළුව හා නව භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි ක්‍රමය මඟින් භාණ්ඩාගාර බිල්පත් සහ කෙටිකාලීන භාණ්ඩාගාර බැඳුම්කර නැවත අලුත් කිරීමේ ප්‍රමාණයන් අඩු කිරීමට අපේක්ෂා කෙරේ
- වසර 5, වසර 10, වසර 15, වසර 20 හා වසර 30 සඳහා වන භාණ්ඩාගාර බැඳුම්කර පරිණතයන් සඳහා නිශ්චිත පරිමාවක් නිකුත් කිරීමේ ක්‍රමවේදය (Tap Issuance) හඳුන්වා දීමේ ඇති හැකියාව පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව අධ්‍යයනය කරමින් සිටී
  - පිරිනැමෙන ප්‍රමාණය සීමා වන අතර එලදා අනුපාතික දින 364ක කල් පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතිකයට ආන්තිකයක් සහිතව සම්බන්ධ කෙරේ
  - වෙන්දේසියට එක්වීම සඳහා දේශීය හා විදේශීය ආයෝජකයින්ට ආරාධනා කෙරේ

# මැදි කාලීනව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ණය තොගය ක්‍රමයෙන් අඩු කෙරෙන අතර එය දළ දේශීය නිෂ්පාදිතය සමඟ සම්බන්ධ කෙරේ...

- **2019 වසර අවසානය වන විට ද.දේ.නි.යෙන් 18%ක් ද 2020 වසර අවසන් වන විට ද.දේ.නි.යෙන් 17%ක් ද වූ, 2021 වසර අවසන් වන විට ද.දේ.නි.යෙන් ආසන්නව 16%ක් විය හැකි ජාත්‍යන්තර ස්වෛරත්ව බැඳුම්කර වගකීම ඉදිරි වසර 3 තුළ ද.දේ.නි.යෙන් 10%ක් දක්වා අඩු කිරීම, රජය සහ මහ බැංකුවෙහි ප්‍රතිපත්තිය වනු ඇත**

**නොපියවූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වටිනාකම සහ නාමික ද .දේ . නි.**






ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මූර්ත සඵල විනිමය අනුපාතය සැලකීමේදී,ඉදිරි මාස 03 තුළදී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල රුපි. 199 සිට රුපි. 203ක් දක්වා මට්ටමේ තරඟකාරීව පවත්වාගෙන යාම සහ ඉන් අනතුරුව එය සමාලෝචනය කිරීම අපේක්ෂිතයි...



# විදේශ විනිමය සංචිතය කළමනාකරණය කිරීමේදී, ණය ගැනීම් තුළින් සංචිත ගොඩනැගීම සහ අඩු ඉපයීම් ලැබෙන ගෝලීය වත්කම් තුළ ආයෝජනය කිරීම අතර වෙනස කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වනු ඇත...




- ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හරහා ණය ලබා ගැනීමේ දී ශ්‍රී ලංකාව **6.8%** ක සාමාන්‍යයෙන් ගෙවනු ලබන අතර, බටහිර රටවල් තුළ එවැනි ඉපැයීම් ප්‍රතිආයෝජනය කිරීමේ දී **1.4%** ක ප්‍රතිලාභයක් උපයනු ලබයි
- පහත කලාප පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් කලාපීය ආර්ථිකයන් සමග සබඳතා තවදුරටත් ශක්තිමත් කෙරේ
  - දකුණු ආසියාව
  - මැද පෙරදිග
  - නැගෙනහිර හා අග්නිදිග ආසියාව

# ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම: බැංකු/බැංකු නොවන අංශ

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- බැංකු/මූල්‍ය ආයතනවල ශේෂ පත්‍රයන්ගේ ශක්තිය මත පදනම්ව තරඟකාරී කොන්දේසි මත නව විදේශ විනිමය අරමුදල් රැස් කිරීම (ඉලක්කය: එ.ජ.ඩො. බිලි. 1.5) - (කළ යුතුව ඇත)
- විදේශ විනිමය පිටතට ගලායෑම විචක්ෂණශීලී අයුරින් පරීක්ෂා කරන අතරතුර විදේශ විනිමයන්හි තත්ත්වය සමීපව අධීක්ෂණය කිරීම - (කළ යුතුව ඇත)
- මූල්‍ය පනත හරහා බදු සමාව ලබා දීම ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ගලා ඒම් සඳහා පහසුකම් සැලසීම - (කළ යුතුව ඇත)
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය සුරැකුම්පත් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන දිරිමත් කිරීම - (කළ යුතුව ඇත )
- අත්‍යවශ්‍ය ආනයන සඳහා හැකි සෑම විටම පහසුකම් සැලසීම - (දැනට ක්‍රියාත්මක වේ)
- ණය තත්ත්වය පිළිබඳ අනවශ්‍ය සමපේක්ෂණ අවම කිරීම සඳහා අදාළ පාර්ශ්වයන් සමඟ සමීපව කටයුතු කිරීම සහ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය සහ ආර්ථිකය පිළිබඳව ඔවුන්ගේ දැනුම වර්ධනය කිරීම - (දැනට ක්‍රියාත්මක)
- බැංකු නොවන අංශවල ආයෝජනය සඳහා විදේශීය ආයෝජකයින්ට සහාය සැපයීම - (කළ යුතුව ඇත )
- සුළු සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා කොටස් අරමුදලක් පිහිටුවීමට සහයවීම - (කළ යුතුව ඇත )

## ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම:
## වෙළඳ භාණ්ඩ අපනයනකරුවන්

### කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- අපනයන ඉපැයීම් අපේක්ෂිත කාලය තුළ දී රටට ගෙන්වා ගැනීම තහවුරු කිරීම- (දැනට ක්‍රියාත්මක)
- අපනයන මගින් ඉපැයූ විදේශ විනිමය, අන්තර්භාණ්ඩ සහ ආයෝජන යෙදවුම් සඳහා අවසරලත් කොටසක් භාවිත කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා රුපියල්වලට හුවමාරු කිරීම - (කළ යුතුව ඇත)
- 2020 සිට මේ දක්වා කාලය තුළ බැංකුවල තැන්පතු ලෙස පවත්වාගෙන යනු ලබන අපනයන ඉපැයීම් මහ බැංකුවේ නියෝග අනුව රුපියල්වලට හුවමාරු කිරීම - (කළ යුතුව ඇත)
  - මෙම ශේෂයන් අපනයනකරුවන් විසින් ඉදිරි මාස 06ක කාලය තුළ කොටස් වශයෙන් රුපියල්වලට හුවමාරු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ
  - අපනයන ඉපැයීම සඳහා පොලී නොගෙවන විශේෂිත විදේශ මුදල් ගිණුම් හඳුන්වාදීම එම ඉපැයීම් රුපියල් වලට හුවමාරු කිරීම දිරිගනිවනු ඇත
- භාණ්ඩ සහ වෙළඳපොළ විවිධාංගීකරණය තුළින් අපනයන ව්‍යාපාර පුළුල් කිරීම - (දැනට ක්‍රියාත්මක)
- ඉහළ අගය එකතු කළ නිෂ්පාදන වෙත වඩාත් යොමුවීම සඳහා පදනම සැකසීම - (දැනට ක්‍රියාත්මක)
- ව්‍යාපාර පුළුල් කිරීම සහ දේශීය අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීම සඳහා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම - (දැනට ක්‍රියාත්මක)
- ශ්‍රී ලංකා සන්නාමය ප්‍රවර්ධනය කිරීම - (දැනට ක්‍රියාත්මක)

# පුද්ගලික විදේශ මුදල් ගිණුම්

# (PFCA)

(අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC) /
නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්(RFC) ලෙස පෙර හැඳින්වූ)

සඳහා කිසිදු ආකාරයක

<u>**වෙනසක් සිදු නොකරන**</u>

අතර ඔවුන්ට වර්තමානයේ භුක්තිවිඳින පහසුකම් සහ වරප්‍රසාද කිසිදු වෙනසකින් තොරව හිමිවනු ඇත

## ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම:
## සේවා අපනයනකරුවන්

### කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- ප්‍රධාන වශයෙන් තොරතුරු තාක්ෂණ සේවා සඳහා සේවා අපනයන පුළුල් කිරීම සහ ගෝලීය නියෝජනය වර්ධනය කිරීම - (දැනට ක්‍රියාත්මක වේ)
- සේවා අපනයන ඉපැයීම් මෙරටට ගෙන්වා ගැනීම සහ ශ්‍රී ලංකා රුපියල්වලට හුවමාරු කිරීම තහවුරු කිරීම සහ සේවා හා සම්බන්ධ විදේශ විනිමය ප්‍රවාහ අධීක්ෂණය කිරීම සඳහා වන යාන්ත්‍රණයට අනුව සහයෝගයෙන් කටයුතු කිරීම - (කළ යුතුව ඇත)
- සංචාරක කර්මාන්තය යළි ඇරඹුම සඳහා සූදානම් වීම සහ ලැබිය යුතු ඉපැයීම් රට තුළට ගෙන්වා ගැනීම සහ රුපියල්වලට හුවමාරුව සහතික කිරීම - (දැනට ක්‍රියාත්මක වේ)

## ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම: ආනයනකරුවන්

### කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- ආනයන සඳහා වන සමපේක්ෂණ ඉල්ලුම සහ විශාල තොග රැස්කිරීමෙන් වැළකීම - (දැනට ක්‍රියාත්මක වේ)
- සමපේක්ෂණ මිල ඉහළ නැංවීම් හරහා අධික ලාභ ලැබීම වෙනුවට, තම පිරිවැය මත සාධාරණ ලාභයක් රඳවා ගනිමින් දේශීය වෙළඳපොළ වෙත භාණ්ඩ සැපයීම - (දැනට ක්‍රියාත්මක වේ)
- දේශීය යෙදවුම් භාවිත කිරීම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් ව්‍යාපාර විවිධාංගීකරණය කිරීම
- අපේක්ෂිත විදේශ ගලා එම් මත පදනම්ව, අනවශ්‍ය නොවන/ හදිසි නොවන ආනයන සඳහා ආන්තික තැන්පතු අවශ්‍යතා ඉවත් කෙරේනු ඇත

ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම:
කර්මාන්තකරුවන්/ දේපළ සංවර්ධනකරුවන්

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- දේශීය නිෂ්පාදනය සඳහා ආනයනික යෙදවුම් සමපේක්ෂණ ආකාරයෙන් මිලදී ගැනීම් සඳහා යොමු නොවීම - (දැනට ක්‍රියාත්මක වේ)
- දේශීය සහ අපනයන වෙළඳපොළ ඉලක්ක කරගත් නිෂ්පාදනය සඳහා ආයෝජනය කිරීම තුළින් නව අවස්ථා උදාකර ගැනීම - (දැනට ක්‍රියාත්මක වේ)
- ඖෂධ සහ අනිකුත් කර්මාන්ත සඳහා විශේෂයෙන් වෙන්වූ ආයෝජන කලාපයන් භාවිතා කිරීම තුළින් දේශීය ආයෝජන ඉහළ නැංවීම සහ විදේශීය ආයෝජකයින් සමඟ හවුලේ කටයුතු කිරීම කිරීම - (කළ යුතුව ඇත)
- සුඛෝපභෝගී තට්ටු නිවාස ඇතුළු, ශ්‍රී ලංකාවේ දේපළ වෙළඳපොළ වෙත විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කරගැනීමේ අරමුණින් ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීම - (කළ යුතුව ඇත)
- ශ්‍රී ලංකාවේ දේපළ වෙළඳපොළ වෙත විදේශීය ආයෝජන ආකර්ෂණය කිරීමේ අරමුණින් නේවාසික/ දිගු කාලීන වීසා බලපත්‍ර ආදී සහන ලබා දීම සහ ගබඩා පහසුකම්, තොරතුරු තාක්ෂණ කර්මාන්ත සඳහා විශේෂයෙන්ම වෙන් වූ ආයෝජන කලාපවල ආයෝජනය කිරීම සඳහා පෙළඹවීම - (කළ යුතුව ඇත)

## ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම: විදේශ විනිමය හුවමාරුකරුවන්

### කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- දැනට නිකුත් කර ඇති සහ නැවත පිහිටුවන ලද බලපත්‍ර භාවිත කරමින් විදේශ විනිමය ලැබීම් විධිමත් ලෙස බැංකු පද්ධතිය වෙත ගලා ඒම සඳහා කටයුතු කිරීම - (කළ යුතුව ඇත)
- අවිධිමත්, සහ/හෝ නීති විරෝධී විදේශ විනිමය ලැබීම් සහ පිටතට ගලා යන ප්‍රවාහ සඳහා ඉඩ ප්‍රස්ථා ලබා නොදීම - (දැනට ක්‍රියාත්මක)
- විවිධ විනිමය අනුපාතික යටතේ ක්‍රියාත්මක වන සමාන්තර වෙළඳපොළ කටයුතු වලින් වැළකීම - (දැනට ක්‍රියාත්මක)
- සංචාරක කර්මාන්තය නැවත ආරම්භ වීමට සූදානමක් ලෙස, ව්‍යාපාරික ස්ථානවල ඉදිරිපස නවීකරණය කොට ඩිජිටල් තිර සහිතව, ආරක්ෂිත වාතාවරණයක් තුළ සුපිරි වෙළඳ සංකීර්ණ වල ව්‍යාපාර පවත්වා ගැනීම - (කළ යුතුව ඇත)



ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම: විදේශ විනිමය ඉපයීම් ප්‍රේෂණය කරන්නන්

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- විධිමත් මාර්ග හරහා ඉපැයීම් සහ ඉතුරුම් මුදල් ප්‍රේෂණය කිරීම - (දැනට ක්‍රියාත්මක)
- දේශීයව ඉහළ රුපියල් පොලී අනුපාතික සහිත අවස්ථාවන්ගෙන් උපරිම ඵල නෙලා ගැනීම - (දැනට ක්‍රියාත්මක)
- දේශීය බැංකු සමඟ සමීපව කටයුතු කරමින් ඔවුන් ලබා දෙන විවිධ ප්‍රතිලාභ ලබා ගැනීම - (දැනට ක්‍රියාත්මක)
- මහත් පරිශ්‍රමයක් දරා උපයා ගත් මුදල් ඉහළ අවදානමක් සහිත අවිධිමත් ක්‍රම හරහා රට තුළට එවීමෙන් වැළකීම - (දැනට ක්‍රියාත්මක)

# ණය සහ විදේශ විනිමය ගැටලු විසඳීම: කොටස් වෙළඳපොළ/ සාංගමික ණය වෙළඳපොළ

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- විනිමය වෙළඳපොළ සහ පොලී අනුපාතිකයන් නැවත ස්ථාවරත්වයට පැමිණීම තුළින්, ආයෝජනය කිරීම හා වර්ධනය කිරීම සඳහා ඇති ඉඩ ප්‍රස්ථා ප්‍රයෝජනයට ගැනීම
- නව විනිමය සුරැකුම්පත් පනත සම්මත වීමෙන් පසු කොටස් හා සාංගමික ණය උපකරණ සහ ණය පිරිනැමීම් ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම
- මූල්‍ය පනත සම්මත වීමත් සමඟ කොටස් වෙළෙඳපොළට ආයෝජන ආකර්ෂණය කර ගැනීම - (කළ යුතුව ඇත)
- ලැයිස්තුගත සාංගමික ණයකර සඳහා ආයෝජන ආකර්ෂණය කර ගැනීම - (කළ යුතුව ඇත)

## තීරණාත්මක ගැටලු

ණය සහ විදේශ විනිමය සම්බන්ධ ගැටලු

**මූල්‍ය අංශයේ ගැටලු**

සාර්ව ආර්ථික ස්ථායීතාවට අදාළ ගැටලු


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මූල්‍ය අංශයට අදාළව සැලකිලිමත් විය යුතු කරුණු: රජය

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- බැංකු නොවන අංශය ඒකාබද්ධ කිරීමට පහසුකම් සැපයීම සඳහා සුදුසු බදු ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම තුළින් මූල්‍ය අංශය ශක්තිමත් කිරීමේ උත්සාහයන්ට සහාය වීම
- මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා රාජ්‍ය බැංකු මත යැපීම අඩු කිරීම
- ණය ලබා ගන්නා මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමට රජය සතු වාණිජ ව්‍යවසායයන් දිරිමත් කිරීම
- රජය සතු වාණිජ ව්‍යවසායයන් වල ඇතැම් අලාභ රාජ්‍ය බැංකු මගින් මූල්‍යනය කිරීම නැවත්වීම
- ඛනිජ තෙල් වියදම් දැරීම සඳහා රාජ්‍ය බැංකු විසින් ලබා දෙන ණය ප්‍රමාණය අඩු කිරීම

# මූල්‍ය අංශයට අදාළව සැලකිලිමත් විය යුතු කරුණු: මහ බැංකුව

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- වසංගතය හා සම්බන්ධ ආර්ථික සහ සමාජීය කටයුතු සීමා කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සඳහා සහාය වීමට ලබා දුන් ණය සහන කාලය ක්‍රමයෙන් ඉවත් කර දිගු කාලීන සැලසුම් සකස් කිරීම
- මූල්‍ය ආයතනවලට ණය සහනවල බලපෑම තිරසාර ලෙස කළමනාකරණය කළ හැකිවන පරිදි ණය සහන කාලය තුළදී සිදු වූ උපචිත ණය පොළිය මූල්‍යනය කිරීම සඳහා රුපියල් මිලියන 15,000 ක් දක්වා වූ ද්‍රවශීලතා සහනයක් ලබා දීම
- හදිසි ණය පහසුකම් රාමුවක් සකස් කිරීම
- වසංගතයෙන් බලපෑමට ලක්වූ ණය ගැනුම්කරුවන් සඳහා පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම සහ කල්බදු වත්කම් බලය යොදා අත්පත් කරගැනීම 2022.03.31 දක්වා වහාම අත්හිටුවීම
- ණය සහන කාලය තුළ මූල්‍ය ආයතන විසින් පනවා ඇති සියලුම දඩ මුදල් අවලංගු කිරීම
- වඩා හොඳ ආර්ථික පරිමාණානුකූල ඵලයන් සහිත මූල්‍ය ආයතන ඇති කිරීමට මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
- අසාර්ථකභාවයට පත්වූ මුදල් සමාගම් හය සමඟ කටයුතු කිරීමට සහ නව ආයෝජන මඟින් යථා තත්ත්වයට පත් කළ හැකි සමාගම් නැවත පිහිටුවීම සඳහා සක්‍රියව කටයුතු කිරීමට පුළුල් සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
- සියලුම මූල්‍ය ආයතන මඟින් "පශ්චාත් කොවිඩ්" පුනර්ජීවන ඒකක ඇති කරන බවට සහතික වීම
- වෙළඳපොළ තුළ සිදුවන බහු විනිමය හුවමාරු අනුපාතික නැවැත්වීම
- පාලනය සහ කොටස් හිමිකාරිත්වය පිළිබඳ නීති සමාලෝචනය කිරීම

# බැංකු නොවන මූල්‍ය අංශය කඩිනමින් ඒකාබද්ධ කිරීම...

- බැංකු නොවන මූල්‍ය අංශයෙහි දිගු කාලීනව පැවති ගැටලු මඟහරවා ගැනීමට සහ ආර්ථිකයේ වර්ධනයට එහි දායකත්වය ලබාගැනීම සඳහා මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම සඳහා වූ ප්‍රධාන සැලැස්ම මනාව සැකසීම

- ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම් මෙන්ම නව ප්‍රාග්ධනය බැංකු නොවන මූල්‍ය අංශයට සැපයීම දිරිමත් කිරීම

- ප්‍රධාන සැලැස්මෙහි වන මැදි කාලීන ඉලක්කයන්ට ශක්තිමත් බැංකු නොවන මූල්‍ය ආයතන 25 අනුකූල කරවීම

- සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් 2022 සැප්තැම්බර් 30 දිනට පෙර කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කිරීම

- කඩිනම් නියාමන අනුමැතීන් ලබා දීම හරහා ඒකාබද්ධකරණ වැඩසටහනට පහසුකම් සැලසීම

# පුළුල් සැලැස්මක් සහිතව අසාර්ථකභාවයට පත්වූ මුදල් සමාගම් හය සමඟ කටයුතු කිරීම...

- මූල්‍ය ව්‍යාපාර පවත්වාගෙන යෑමේ බලපත්‍රය අත්හිටුවා හෝ අවලංගු කර ඇති සියලුම බැංකු නොවන මූල්‍ය ආයතන වල ඉදිරි දැක්ම තක්සේරු කිරීම සඳහා සමාලෝචනයකට භාජනය වෙමින් පවතී - (දැනට ක්‍රියාත්මක)
- එවැනි බැංකු නොවන මූල්‍ය ආයතන නැවත යථා තත්ත්වයට පත් කිරීමට හැකි වන්නේ යැයි සැලකෙන්නේ නම්, නිසි ව්‍යාපාර සැලසුමකට යටත්ව ඒවා යළි නඟා සිටුවීම සඳහා ප්‍රාග්ධන ආයෝජන යෙදවීමට සැලසුම් සකස් කිරීම - (සිදු කිරීමට නියමිත)
- අදාළ ක්‍රියාකාරී සැලැස්ම පදනම් කරගෙන අධිකරණ ක්‍රියාවලිවලදී අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම - (සිදු කිරීමට නියමිත)
- බලපත්‍ර අත්හිටුවා ඇති බලපත්‍රලාභී මූල්‍ය සමාගම්හි ආයෝජනය කළ හැකි ආයෝජකයන් සමඟ සාකච්ඡා කිරීම - (සිදු කිරීමට නියමිත)

# “නව සාමාන්‍යකරණය” තුළ බැංකු අධීක්ෂණය කිරීම නව අභියෝගයක් වනු ඇත...

- එතැන් සහ විතැන් නිරීක්ෂණ කණ්ඩායම් ඒකාබද්ධ කරමින් "අධීක්ෂණ කණ්ඩායම්" පිහිටුවීම - (දැනට ක්‍රියාත්මක)
- බලපත්‍රලාභී බැංකුවල ශේෂපත්‍ර සහ ව්‍යාපාර අකෘති කෙරෙහි සහ වෙළඳපොළ ව්‍යුහයන් සහ භාවිතාවන් කෙරෙහි ඇතිවිය හැකි අර්බුදයේ දිගුකාලීන බලපෑම් සඳහා ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම - (සිදු කිරීමට නියමිත)
- පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු සහ අධීක්ෂණමය වශයෙන් සැලකිලිමත් විය යුතු කරුණුවල ස්වභාවය සලකා බලමින් අධීක්ෂණ කටයුතු ප්‍රමුඛතාගත කිරීම - (දැනට ක්‍රියාත්මක)
- බාධාවකින් තොරව සන්නිවේදනය සිදු කිරීමට බැංකුවල ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සමග සිදු කරන රැස්වීම්/සාකච්ඡා පැවැත්වීම සඳහා මංගත මාධ්‍ය වෙත මාරු වීම - (දැනට ක්‍රියාත්මක)
- දත්ත විශ්ලේෂණය සහ අවදානම් පදනම් කරගත් අධීක්ෂණය, වැඩ ප්‍රවාහ කළමනාකරණය සහ පාරිභෝගික විමසුම් කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණය මත පදනම් වූ අධීක්ෂණය (SupTech) සහ කෘත්‍රීම බුද්ධිය (Artificial Intelligence) යොදා ගැනීමට හැකි මාර්ග ගවේෂණය කිරීම - (සිදු කිරීමට නියමිත)
- සාර්ව ආර්ථික අභියෝග සහ ඒවායින් බැංකු ක්ෂේත්‍රය මත ඇතිවන බලපෑම් සලකා බැලීම - (සිදු කිරීමට නියමිත)
- ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව, ණය සහන කාලයක් ලබාදීම සහ වාර්තා කිරීම යනාදිය සම්බන්ධයෙන් නම්‍යශීලී පියවර ක්‍රියාත්මක කිරීම සහ එවැනි ලිහිල් කිරීම් කාලෝචිත ලෙස ඉවත් කිරීමට පහසුකම් සැලසීම - (දැනට ක්‍රියාත්මක)

# ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ විශ්වසනීයත්වය ශක්තිමත් කිරීම සහ ආරක්ෂා කිරීම...

- රට තුළ මුදල් විශුද්ධිකරණය/ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් පැතිකඩ හඳුනා ගැනීම සහ මීළඟ අවුරුදු පහ (2022 සිට 2027) සඳහා රටෙහි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ වැඩසටහන් රාමුව සකස් කිරීම සඳහා ජාතික අවදානම් තක්සේරුව නිම කිරීම - (දැනට ක්‍රියාත්මක)
- ජාතික අවදානම් තක්සේරුවෙහි ප්‍රතිඵලවලට අනුකූලව මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා වන ජාතික ක්‍රමෝපාය යාවත්කාලීන කිරීම සහ අවදානම මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අධීක්ෂණය ශක්තිමත් කිරීම - (දැනට ක්‍රියාත්මක)
- රට තුළ ආයෝජකයන්ට හිතකර පරිසරයක් ඇති කිරීම සඳහා සියලු පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම - (දැනට ක්‍රියාත්මක)
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රටේ සමස්ත මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතාව වැඩි දියුණු කිරීම - (දැනට ක්‍රියාත්මක)

# ගෙවීම් සහ පියවීම් පද්ධතිය තවදුරටත් දියුණු කිරීම...

- ජාතික ගෙවීම් කවුන්සිලය විසින් සකසන ලද ජාතික ඩිජිටල් ගෙවීම් පිළිබඳ පෙර දැක්ම 2022 – 2024 ප්‍රකාශයට පත් කිරීම
- ඩිජිටල් ගෙවීම් ක්‍රම ව්‍යාප්තිය සහ අනුගතවීම ඉහළ නැංවීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ගෙවීම් ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපත්තිමය සංඥා සහ මෙහෙයුම් ඉලක්ක සැපයීම
- “මුදල් භාවිතය අඩු” සමාජයක් ගොඩ නැගීම අරමුණු කිරීම
- ඩිජිටල් මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සහ විධිමත් ආර්ථිකයට සම්බන්ධ වීම සඳහා අවිධිමත් අංශය දිරිමත් කිරීමේ ක්‍රමයක් ලෙස ඩිජිටල්කරණය භාවිතා කිරීම
- මුදල් හෝ මූල්‍ය වටිනාකම් හුවමාරු කිරීමේ සේවා සපයන ආයතන නියාමනය කිරීම
- “විවෘත බැංකුකරණ” කටයුතු සඳහා නියාමන සහ පාලන ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම
- ශ්‍රී ලංකාව තුළ බැංකුකරණය සඳහා කෘතිම බුද්ධිය භාවිතය පිළිබඳ සලකා බැලීම
- මහ බැංකු ඩිජිටල් මුදල් ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට ඇති හැකියාව සලකා බැලීම
- පාරිභෝගික පහසුව සඳහා බ්ලොක්චේන් තාක්ෂණය පදනම් කරගත් ගනුදෙනුකරු හඳුනා ගැනීම සඳහා වූ සංකල්ප සාධන ව්‍යාපෘතියෙන් ඉලෙක්ට්‍රොනික ලෙස ගනුදෙනුකරු හඳුනා ගැනීම ආරම්භ කිරීම
- PayPal පහසුකම ලබා ගැනීම සඳහා අඛණ්ඩව කටයුතු කිරීම

## මූල්‍ය අංශයට අදාළව සැලකිලිමත් විය යුතු කරුණු:

# බැංකු අංශය

### කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක ප්‍රමාණවත් මට්ටම්වල පවත්වා ගැනීම
- විදේශ විනිමය ගණුදෙනු විනිවිදභාවයකින් යුතුව පවත්වා ගැනීම
- මෙහෙයුම් කටයුතුවල අවදානම් ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම
- වසංගතය හා සම්බන්ධ දුෂ්කරතාවලට මුහුණ දෙන පාරිභෝගිකයන්ට සහායවීම සඳහා පුනර්ජීවන ඒකක පිහිටුවීම
- කලාපීය ව්‍යාප්තිය පුළුල් කිරීම සහ අක්වෙරළ ව්‍යාපාර ආකර්ශණය කර ගැනීම
- කොළඹ වරාය නගරයෙහි නව අවස්ථා සොයා බැලීම
- සහන ණය කාලසීමාව යටතේ සහ අක්‍රීය ණය කාණ්ඩ යටතේ ඇති ව්‍යාපාර නැවත යථා තත්ත්වයට පත්කිරීමේ අරමුණින් එම ව්‍යාපාරවල කොටස්වල සහභාගිත්වයට සහාය වීමට මූල්‍ය ක්‍රමවේද සලකා බැලීම

# මූල්‍ය අංශයට අදාළව සැලකිලිමත් විය යුතු කරුණු:

## කොටස් වෙළඳපොළ සහ සාංගමික ණය වෙළඳපොළ සහභාගිවන්නන්

*කළ යුතු කාර්යයන් ලැයිස්තුව*

- මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා කොටස් නිකුතුන් හා ලැයිස්තුගත ණය මගින් ප්‍රාග්ධනය රැස්කර ගැනීම දිරිමත් කිරීම
- නව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත බලාත්මක වීමත් සමඟ ආයෝජන අවස්ථා විවිධාංගීකරණය කිරීමට දිරිමත් කිරීම

# තීරණාත්මක ගැටලු

ණය සහ විදේශ විනිමය සම්බන්ධ ගැටලු

මූල්‍ය අංශයේ ගැටලු

**සාර්ව ආර්ථික ස්ථායීතාවට අදාළ ගැටලු**


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## සාර්ව ආර්ථික ස්ථායීතාවයට අදාළව සැලකිලිමත් විය යුතු කරුණු: රජය

### කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- පහසුවෙන් අනුකූල විය හැකි ලෙස සැලසුම් කළ බදු ව්‍යුහයක් සමඟ "ආයෝජක හිතකාමී" අයවැයක් හඳුන්වා දීම
- රාජ්‍ය මූල්‍ය හිඟය තිරසාර ලෙස අඩු කිරීම
- මහ බැංකුවේ උපදෙස් ලබාගනිමින්, පැහැදිලි ඉලක්ක සහිතව විශ්වාසනීය මැදි කාලීන ණය කළමනාකරණ උපායමාර්ගයක් ඉදිරිපත් කිරීම - (දැනට ක්‍රියාත්මක)
- ණය නොගෙවා කල්පිරීමේ සාමාන්‍ය කාලය දීර්ඝ කිරීම සඳහා කටයුතු කිරීම - (දැනට ක්‍රියාත්මක)
- ව්‍යාපාර පවත්වාගෙන යාමේ පරිසරය සඳහා බලපෑ හැකි සියලුම සාධක සලකා බලමින්, දේශීය සහ විදේශීය ආයෝජකයන් සඳහා ව්‍යාපාර පරිසරය වැඩිදියුණු කිරීම
- අත්‍යවශ්‍ය නොවන වියදම් තාර්කීකරණය කිරීම

# ශ්‍රී ලංකාවේ භෞතික ආයෝජන අවස්ථාවන්හි පරිපූර්ණ නාමාවලියක් සැකසීම රජය විසින් අවසන් කර ඇත...

## නාගරික සංවර්ධනය

| | |
|---|---|
| නගර මධ්‍යස්ථානය, බත්තරමුල්ල | එ.ජ.ඩො.මිලි. 75 |
| වරාය නගරයට ස්වර්ණමය දොරටුව (චාමර්ස් ධාන්‍යාගාරයේ සංවර්ධනය) | එ.ජ.ඩො.බිලි.1 |
| නව නගරය, නාරාහේන්පිට (නාගරික මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක්) | එ.ජ.ඩො.මිලි.170 |

## ධීවර හා ජලජීවී වගාව

| | |
|---|---|
| කරෙයිනගර් බෝට්ටු අංගනය සංවර්ධනය කිරීම | තීරණය කිරීමට නියමිතය |
| මුහුදු කූඩැල්ලන් වගාව ව්‍යාප්ත කිරීම: අක්කර 5,000ක් දක්වා | අක්කරයකට රු. 500,000 (එ.ජ.ඩො. 2,500) |
| කාබනික පොහොර නිෂ්පාදනය සඳහා අමු ද්‍රව්‍යයක් ලෙස මුහුදු වල් පැළෑටි වගා කිරීම | රු.මිලි.50 |

## දේපළ වෙළඳාම්

| | |
|---|---|
| කොළඹ / වරාය නගරයේ සුඛෝපභෝගී හෝටල් සංවර්ධනය | එ.ජ.ඩො.මිලි.229.0 |
| වරාය නගර සංචාරක නිවාස සංවර්ධනය | එ.ජ.ඩො.මිලි. 362.5 |
| වරාය නගරයට ආසන්නයේ මිශ්‍ර සංවර්ධනය | එ.ජ.ඩො.මිලි.355 |
| වරාය නගරයේ සම්මේලන මධ්‍යස්ථානය | එ.ජ.ඩො.මිලි. 300 |





## විදුලි බල හා බලශක්ති

| | |
|---|---|
| මෙගාවොට් 100 ක සුළං බලාගාරය - පූනරින් | එ.ජ.ඩො.මිලි.130 |
| මෙගාවොට් 100 ක සුළං බලාගාරය - මන්නාරම දෙවන අදියර | එ.ජ.ඩො.මිලි.100 |
| මෙගාවොට් 100 ක සූර්ය බල ව්‍යාපෘතිය - සියඹලාණ්ඩුව | එ.ජ.ඩො.මිලි.100 |

## ඖෂධ

| | |
|---|---|
| හම්බන්තොට ඖෂධ කලාපය | එ.ජ.ඩො.මිලි. 5 සිට |
| අනුරාධපුර, ඔයාමඩුව හි ඖෂධ කලාපය (දේශීය ආයෝජකයන්ට පමණක් අවසර හිමි වේ) | රු.බිලි.28.2 (එ.ජ.ඩො.මිලි.141) |

# සාර්ව ආර්ථික ස්ථායීතාවයට අදාළව සැලකිලිමත් විය යුතු කරුණු: මහ බැංකුව

## කළ යුතු කාර්යයන් ලැයිස්තුව

- මැදි තනි අගයක උද්ධමනය පවත්වා ගැනීම සහතික කිරීම
- පොලී අනුපාතික සහ විනිමය අනුපාතිකයේ ස්ථායිතාව සහතික කිරීම
- තහනම් පිරමීඩ ක්‍රම සහ වෙනත් මුල්‍ය වංචා නතර කිරීමට අඛණ්ඩව පියවර ගැනීම
- ක්‍රමානුකූලව ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ආපසු හැරවීමේ ක්‍රියාමාර්ග සහ විදේශ සංචිත ගොඩ නැගීම මගින් මහ බැංකු ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම
- බලපත්‍රලාභී බැංකුවල තොරතුරු තාක්ෂණ අවදානම් සඳහා ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියෝග හඳුන්වා දීම
- විතැන් පරීක්ෂා කිරීම් ශක්තිමත් කිරීම සහ මුල්‍ය ආයතන වල පාලනය ඇතුළු අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම
- මහජනතාව දැනුම්වත් කිරීමේ වාර ගණන සහ ක්‍රම වැඩි කිරීම
- හරිත මූල්‍යන පහසුකමක් ආරම්භ කිරීම
- ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම
- මුදල් නීති පනත යටතේ මුල්‍ය පාරිභෝගික ආරක්ෂාව සඳහා නව රෙගුලාසි ඇති කිරීම
- මහබැංකු වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍යය හරහා පරිශීලනයට වඩා පහසු මාර්ගගත පැමිණිලි ඉදිරිපත් කිරීමේ පහසුකම් හඳුන්වා දීම
- ප්‍රාදේශීය කාර්යාලවල 'ණය උපදේශන මධ්‍යස්ථාන' සහ 'ආයෝජන උපදේශන මධ්‍යස්ථාන' පිහිටුවීම
- අර්බුදයන්ට ලක්වූ ව්‍යාපාර වලට ආධාර කිරීම සඳහා 'කොටස් අරමුදල්' පිහිටුවීමට පහසුකම් සැලසීම සහ එමගින් අක්‍රීය ණය ඉහළයෑම වළක්වා ගැනීම
- “අත්‍යවශ්‍ය නොවන/ හදිසි නොවන ආනයන” සඳහා පනවා තිබූ ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාව වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීම
- වෙළඳපොළ තුළ ඉහළ වට්ටම් පවතී නම්, 2022 වසරේ ජනවාරි මාසයේදී සහ/හෝ 2022 ජූලි මාසයේදී කල් පිරෙන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි සමස්ත නිකුතුවම ආපසු මිලදී ගැනීම පිළිබඳ සළකා බැලීම

# මුදල් අංශය සැලකූ විට, උද්ධමනය ඉලක්කගත 4-6% පරාසය තුළ පවත්වා ගැනීමට ප්‍රමුඛතාව ලබා දෙනු ඇත...




- මෑත කාලීන දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් මැදිකාලීනව උද්ධමන පීඩන ඇති වීම වැළැක්වීමට සහාය වනු ඇත
- ගෝලීය වශයෙන් අවධානයට ලක්ව ඇති කරුණක් වන ආහාර උද්ධමනය පාලනය කිරීම සඳහා රජයට ඉලක්කගත පියවර නිර්දේශ කෙරේ

අඛණ්ඩව මාස 150 කට අධික කාලයක් පුරා **තනි ඉලක්කමක මට්ටමේ උද්ධමනය** පවත්වා ගනිමින් තැබූ වාර්තාව, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග තුළින් තවදුරටත් පවත්වා ගනු ඇත

# මහ බැංකුව 2022 මුල් භාගයේ සිට සවිස්තරාත්මක මුදල් ප්‍රතිපත්ති වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරනු ලබයි...

*මෙය වගවීම සහ විනිවිදභාවය වැඩිදියුණු කරනු ඇත...*




*... ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ට අනාගත ගමන් මඟ පිළිබඳ වැඩි පැහැදිලි කිරීමක් ලබා දෙමින්!*

# මූල්‍ය පද්ධතියේ සමස්ත ස්ථායීතාව සහතික කිරීමට සහ මුදල් ප්‍රතිපත්තියට සහාය වීමට අවශ්‍ය වන පරිදි සාර්වවිචක්ෂණ ප්‍රතිපත්ති මෙවලම් භාවිත කරනු ඇත...




- මහ බැංකුව විසින් විශේෂයෙන්ම වාහන ඇතුළු වත්කම් මිල ගණන් වෙනස් වීම සහ ඉහළ යෑම නිරීක්ෂණය කර ඇත
- ඕනෑම දිගු කල් පවත්නා මිල ඉහළ යෑමේ පීඩනයක් සහ ඉන් දේශීය මූල්‍ය පද්ධතිය අස්ථාවර වීමට ඇති අවදානම පූර්වෝපායිකව වළක්වා ගැනීම සඳහා, වටිනාකම් මත ණය අනුපාත, ආදායම් මත ණය අනුපාත සහ ආර්ථික චක්‍රයන්ට ප්‍රතිවිරුද්ධ ක්‍රියාමාර්ග ඇතුළු සාර්ව විචක්ෂණ මෙවලම් භාවිතා කිරීම හරහා කටයුතු කරනු ඇත.
- මූල්‍ය පද්ධතිය තුළ පද්ධතිමය අවදානම් ගොඩනැගීම වැළැකීම සඳහා වෙනත් විචක්ෂණශීලී පියවරයන් භාවිත කරනු ඇත
- මහ බැංකුවේ සාර්වවිචක්ෂණ නිරීක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත

# තිරසාර සංවර්ධනය පිළිබඳ දිගු කාලීන දැක්මකින් යුතුව, දේශීය සහ විදේශීය සම්පත් ලබා ගැනීම සඳහා හරිත මූල්‍යන විකල්ප ගවේෂණය කරනු ඇත...

- හරිත/ තිරසාර මූල්‍යන ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම
- පහත සඳහන් අංශ වෙත ණය ලබාදීම ප්‍රවර්ධනය සඳහා බැංකුවලට මාර්ගෝපදේශ නිකුත් කරනු ඇත:
  - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති (සූර්ය බලශක්ති ව්‍යාපෘති, ජල විදුලි ව්‍යාපෘති, සුළං බල ව්‍යාපෘති සහ ඝන අපද්‍රව්‍ය මගින් විදුලිය නිපදවීමේ ව්‍යාපෘති ආදිය)
  - දේශගුණික අනුවර්තන සහ බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘති (ගංවතුර අඩු කිරීමේ ව්‍යාපෘති, වෙරළ සංරක්ෂණ ව්‍යාපෘති ආදිය)
  - පරිසර හිතකාමී/තිරසාර කෘෂිකර්මාන්තය (කාබනික ගොවිතැන, සුහුරු කෘෂිකාර්මික විසඳුම්)
  - බලශක්ති පිරිමැසුම් යන්ත්‍රෝපකරණ/උපකරණ සහ පොදු ප්‍රවාහන සේවා සඳහා පරිසර හිතකාමී වාහන මිලදී ගැනීම
  - ජල සම්පාදන/කළමනාකරණ ව්‍යාපෘති
  - හරිත ඉදිකිරීම් ව්‍යාපෘති (හරිත ගොඩනැගිලි, දේශගුණයට ඔරොත්තු දෙන ඉදිකිරීම් ව්‍යාපෘති ආදිය)
  - අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති

බැංකු මගින් අරමුදල් සපයන නව හරිත ව්‍යාපෘති සඳහා මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙහි 1%ක වැඩි කිරීමකට සමාන අරමුදල් ප්‍රමාණයක් නිකුත් කරනු ඇත

බහුපාර්ශ්වික නියෝජිත ආයතනවලට සහ ‘දේශගුණික හිතකාමී’ ජාත්‍යන්තර ආයෝජක ප්‍රජාවට ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන ගමන් මග හා සම්බන්ධ වීමට සාදරයෙන් ආරාධනා කරමු

හරිත / තිරසාර මූල්‍යනය වර්ගීකරණ සම්පූර්ණ කිරීම මඟින් හරිත ව්‍යාපෘති සඳහා තවදුරටත් සහාය ලැබෙනු ඇත.

# සැමට ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ ආර්ථික වර්ධනයක් ඇති කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ...

- "උසස් ජීවන තත්ත්වයන් අත්පත් කරගැනීම සඳහා ගුණාත්මක අන්තර්ගතභාවයක්"යන තේමාව යටතේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රථම ජාතික උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම
- ප්‍රජාව අතර සෞඛ්‍ය සම්පන්න ජීවන තත්ත්වයන් සහ යහපත් පුරුදු වැඩිදියුණු කිරීම සඳහා තෝරාගත් ගම්මාන හරිත ගම්මාන බවට පත් කිරීමෙන් පරිසර හිතකාමී ග්‍රාමීය පරිසරයක් ප්‍රවර්ධනය කිරීම
- ප්‍රාදේශීය කාර්යාල හයෙහි සහයෝගය ඇතිව ප්‍රාදේශීය සංවර්ධන කාර්යය ශක්තිමත් කිරීම
- සියලුම ඉල්ලුම් සහ සැපයුම් පාර්ශ්වීය වෙළඳපොළ සම්බන්ධතා එකම මාර්ගයකට ගෙන ඒම සඳහා කෘෂිකාර්මික සංවර්ධන වටිනාකම් දාම ආධාරක සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ හඳුන්වා දීම
- ග්‍රාමීය ප්‍රජාව අතර වැඩි රැකියා අවස්ථාවන් උත්පාදනය කරමින් සහ ප්‍රාදේශීය ආදායම් විෂමතා අඩු කරන අතර ම, විධිමත් මූල්‍ය අංශයේ සහයෝගය ලබා දෙමින්, ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීම සඳහා සහන ණය යෝජනා ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ
- දීපව්‍යාප්තව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට මූල්‍යකරණය පුළුල් කිරීමට සහ මූල්‍ය වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා සහාය ලබා දීම
- මූල්‍ය සාක්ෂරතාව සහ ශක්‍යතාව ඉහළ නැංවීමේ වැඩසටහන් තුළින් මූල්‍ය සාක්ෂරතාව තවදුරටත් ප්‍රවර්ධනය කිරීම
- මූල්‍ය අන්තර්ගතභාවය, ණය පරිපූරක යනාදිය සම්බන්ධව ජාත්‍යන්තර අනුබද්ධිත සංවිධාන සමග සබඳතා පවත්වා ගැනීම සහ ජාත්‍යන්තර වැඩසටහන් පැවැත්වීම

# මංගත ක්‍රමවේදයන් හරහා ක්‍රියාත්මකවන යෝජනා ක්‍රම ද ඇතුළුව, තහනම්/ පිරමීඩ යෝජනා ක්‍රම මැඩපැවැත්වීමට අවශ්‍ය පියවර ගනු ඇත...

**තහනම් යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමෙන් සාමාන්‍ය ජනතාව වැළැක්වීම සඳහා 1988 අංක 30 දරණ බැංකු පනත යටතේ පැවරී ඇති බලතල යටතේ මහ බැංකුව විසින් තවදුරටත් ගනු ලබන පියවර යටතට පහත දැක්වෙන පියවර ඇතුළත් වේ.**

- **තහනම් යැයි සැක කෙරෙන තහනම් යෝජනා ක්‍රම හා වෙනත් මූල්‍ය වංචාවන් පිළිබඳ තොරතුරු හා පැමිණිලි පිලිබඳව කරුණු සෙවීමේ පරීක්ෂණ පැවැත්වීම - (දැනට ක්‍රියාත්මක)**
- **වැරදි කරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා පරීක්ෂණ පවත්වා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට වාර්තා කිරීම - (දැනට ක්‍රියාත්මක)**
- **තහනම්/පිරමීඩ යෝජනා ක්‍රම පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුම්වත් කිරීම - (දැනට ක්‍රියාත්මක)**
  - රට පුරා දැනුම්වත් කිරීමේ වැඩ සටහන්/ සම්මන්ත්‍රණ/ මංගත සැසි
  - මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා මාධ්‍ය දැන්වීම් සහ මාධ්‍ය නිවේදන
  - ගුවන් විදුලි හා රූපවාහිනී සාකච්ඡා
  - පුවත්පත් සාකච්ඡා සහ ලිපි
  - පෝස්ටර්, යූ ටියුබ් සහ වෙනත් සමාජ මාධ්‍ය ව්‍යාපාර
  - දුරකථන හා ඊමේල් විමසීම් මඟින් ප්‍රතිචාර දැක්වීම



## පවතින කොවිඩ් -19 වසංගතය හේතුවෙන් සාමාන්‍ය ජනතාවගේ ඉහළ ගිය මුදල් අවශ්‍යතාවන් කළමනාකරණය කරගන්නා අතර, ගෙවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය මුදල් ඉල්ලුම් මහ බැංකුව සපුරාලනු ඇත...

- ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය තුළින් මුදල් චක්‍රයේ කාර්යක්ෂමතාව ඉහළ නංවා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම
- නුසුදුසු හා යල් පිනූ කාසි බැහැර කිරීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
- නරඹන්නන් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම සඳහා ආර්ථික ඉතිහාස කෞතුකාගාරය වැඩි දියුණු කිරීම




ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# වසංගතය හේතුවෙන් ඇති වන දුෂ්කරතා මගහරවා ගැනීම සඳහා මහ බැංකුව අදාළ පාර්ශ්වකරුවන් වෙත සුපරීක්ෂාකාරීව මග පෙන්වනු ඇත...

- මුදල් ප්‍රවාහ අඛණ්ඩව ලැබීම තහවුරු කිරීම
- ණය දීම් සහ තැන්පතු යන දෙඅංශයෙහිම උපකරණ සඳහා තරඟකාරී හා සාධාරණ මිල ගණන් පවත්වා ගැනීම
- ගනුදෙනු නිරීක්ෂණය ශක්තිමත් කිරීම
- ඇතැම් මූල්‍ය ආයතන විසින් දැනට පනවා ඇති පෙර පියවීම් ගාස්තු සහ ඉදිරි කාලය සඳහා වර්තමානයේ පොලී අය කිරීම් අත්හිටුවීම

# අපි “ප්‍රතිඵල ඉලක්ක කරගනිමින්” ක්‍රියාත්මක වන්නෙමු...

# සාරාංශයක් ලෙස, මෙහි දක්වා ඇති පරිදි අපි මූලික ක්‍රියාමාර්ග සහ මෙවලම් කිහිපයක් යොදාගනු ලබන අතර, මෙම ක්‍රියාමාර්ග එකවර ක්‍රියාවට නැංවීමට කටයුතු කරනු ඇත...

- රටෙහි බොරතෙල් බිල්පත් ගෙවීමට අවශ්‍ය මුදල් සපයමින් විදේශ විනිමය වෙළඳපොළ වෙත ද්‍රවශීලතාව සැපයීම
- විනිමය අනුපාතිකය පිළිබඳ සහතිකයක් ලබා දී රුපියල් වටිනාකම මගින් නාමනය කරන ලද රජයේ සුරැකුම්පත්වල ආයෝජන ප්‍රවර්ධනය කිරීම
- අපනයන ඉපැයීම් ලැබීම් අනිවාර්යයෙන් රුපියල්වලට පරිවර්තනය කිරීම ශක්තිමත් කිරීම
- විදේශ විනිමය ආපසු නොගෙන්වුවහොත් සහ පරිවර්තනය නොකළහොත් අපනයනකරුවන්ගේ ලාභ සඳහා 14%ක බද්දක් නොව 28%ක බද්දක් අයකරන ලෙස රජයෙන් ඉල්ලීම
- බලපෑමට ලක්වූ මුදල් සමාගම් සඳහා ද්‍රවශීලතා ආධාර සපයන අතර ම ණය සහන කාලය දීර්ඝ කිරීම සඳහා කටයුතු කිරීම
- වසංගතයෙන් බලපෑමට ලක්වූ ණය ගැනුම්කරුවන් සඳහා පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම සහ වාහන නැවත පවරා ගැනීම ඉදිරි මාස 6ක කාලයකට අත්හිටුවීම
- වසංගතය හේතුවෙන් දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ට සිදුවූ හානිය අවම කිරීම සඳහා, සැලසුම් කළ යාන්ත්‍රණයක් හරහා, හිඟ පොළිය පියවීමට රුපියල් මිලියන 15,000ක් වෙන්කිරීම
- වසංගත කාලය තුළ අවශ්‍ය මුදල් සැපයීමට ගත් ක්‍රියාමාර්ගයන් නැවත හැරවීම සඳහා මුදල් ප්‍රතිපත්ති උපකරණ භාවිතා කිරීම
- මූල්‍ය අංශය තිරසාර ස්ථාවරත්වයක් කරා මෙහෙයවීම සඳහා සාර්ව විචක්ෂණ මෙවලම් මෙන්ම සූක්ෂම විචක්ෂණ නියාමනය සහ අධීක්ෂණය භාවිතා කිරීම
- අධ්‍යාපනය හා සෞඛ්‍ය අවශ්‍යතා සඳහා විදේශ විනිමය කඩිනමින් ලබාගැනීමට පහසුකම් සැපයීම

- සංක්‍රමණික දීමනාව සහ ආයෝජන පිටතට ගලායම් මත පනවා ඇති උපරිම සීමාව 2022 ජනවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කිරීම
- “අත්‍යවශ්‍ය නොවන/ හදිසි නොවන ආනයන” සඳහා පනවා තිබූ ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාව වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවීම
- 2022 ජනවාරි 01 දින සිට ආරම්භ වන පරිදි විදේශ විනිමය ගණුදෙනු අධීක්ෂණය කිරීම සඳහා ජාත්‍යන්තර ගණුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) ස්ථාපිත කිරීම
- සේවා සම්බන්ධ විදේශීය විනිමය ගලා ඒම් අධීක්ෂණය කිරීම සහ එම මුදල් ආපසු රට තුළට ගෙන්වා ගැනීම හා පරිවර්තනය කිරීම සහතික කිරීම
- කල්පිරෙන ණය බැඳීම් හැකි සෑම අවස්ථාවකදී ම ණය නොවන මූලාශ්‍ර හරහා ලැබෙන නව ලැබීම් මඟින් පියවීම
- වෙළඳපොළ තුළ ඉහළ වට්ටම් පවතී නම්, 2022 වසරේ ජනවාරි මාසයේදී සහ/හෝ 2022 ජූලි මාසයේදී කල් පිරෙන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි සමස්ත නිකුතුවම ආපසු මිලදී ගැනීම පිළිබඳ සළකා බැලීම
- ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 10%ක් හෝ ඊට අඩු වන තුරු, කල් පිරෙන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර රජය විසින් අනෙකුත් රාජ්‍යයන්ගෙන් ලබාගන්නා ණය හරහා පියවීමට කටයුතු කිරීම
- ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීමට පියවර ගැනීම
- නිල මාර්ග ඔස්සේ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලබාගැනීම සඳහා දිරිමත් කිරීම
- මුදල් හුවමාරු කරන්නන්ගේ බලපත්‍ර නැවත ලබා දීමෙන් ඔවුන් විධිමත් අංශයට යොමු කිරීම

# ක්‍රියාවට නංවන ලද ක්‍රියාමාර්ග තුළින් මහජනතාව වර්තමානයේ මුහුණ දෙන දුෂ්කරතා ලිහිල් වනු ඇත...

- පහත දැක්වෙන ක්‍රියාමාර්ග හරහා ඍජු ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාවට හිමිවෙනු ඇත:
  - ණයපත් මගින් සිදු කරන ගෙවීම් ඇතුළත්ව, අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට අදාළ විදේශ විනිමය ගෙවීම් සඳහා පහසුකම් සැලසීම
  - 2022 වසරේ ජනවාරි මාසයේ දී සංක්‍රමණ දීමනා මත පැන වූ සීමා ඉවත් කිරීම
  - ඉන්ධන සහ අනෙකුත් අත්‍යවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීම මගින් බාධාවකින් තොරව සැපයුම් ලබා දීම සහතික කිරීම
  - තැන්පතු පොලී අනුපාතික නිවැරදි කිරීමත් සමඟ ඉතිරි කරන්නන් සඳහා මූර්ත ප්‍රතිලාභ වර්ධනය කිරීම
  - සාධාරණ ණය පොලී අනුපාතික යටතේ ණය ලබා ගැනීමට සහාය වීම
  - ස්ථාවර මිල මට්ටම් පවත්වා ගනිමින් ජීවන වියදම අවම කිරීම
  - මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සහතික කිරීම මගින් මහජනතාවගේ ඉතුරුම් ආරක්ෂා කිරීම

**මෙම ප්‍රතිඵල, කොවිඩ්-19 වසංගතයේ බලපෑම් වලින් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයින්ට යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය වීමට මහ බැංකුව සහ රජය විසින් දැනටමත් ගෙන ඇති ක්‍රියාමාර්ග සඳහා අනුපූරක වනු ඇත**

# 2022 වසරේ මාර්තු මාසය අවසාන වන විට අපි පහත ප්‍රතිඵල අපේක්ෂා කරන්නෙමු...

- දළ නිල සංචිත අවම ලෙස ආනයන මාස 04ක් ආවරණය කිරීමට හැකි මට්ටමක් දක්වා වර්ධනය කිරීම
- රුපියල්වලින් වටිනාකම නාමකරණය කරන ලද රජයේ සුරැකුම්පත්වල විදේශීය ආයෝජන 2.5%ක් වීම (එ.ජ.ඩො. මිලියන 1,000)
- ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජක පදනම විවිධාංගීකරණය කිරීම
- ස්ථාවර විනිමය අනුපාතිකය සහ ස්ථාවර පොලී අනුපාතික
- වැඩිදියුණු වූ ශුද්ධ විදේශීය වත්කම් සහ ශුද්ධ දේශීය වත්කම් අතර අනුපාතය සමඟ ශක්තිමත් වූ මහ බැංකු ශේෂ පත්‍රය
- ශක්තිමත් බැංකු සහ බැංකු නොවන අංශය
- සතිපතා සිදු වන භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි රු. බිලියන 50ට වඩා අඩුවෙන් පවත්වා ගැනීම
- මූර්ත ද.දේ.නි. යෙහි වර්ධනය 2021 වසරේ දී 5%ක් පමණ සහ 2022-Q1 දී 6.5%ක් වීම
- උද්ධමනය මැද තනි අගයක ස්ථාවරව පවත්වා ගැනීම

# ඉලක්කගත නව විදේශ විනිමය ලැබීමේ සහ නොපියවා ඉදිරියට ගෙන යෑමේ කාලරාමු සාරාංශය - *රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

| පාර්ශ්වකරු | 2021 ඔක්. - දෙසැ. | 2022 ජන. - මාර්තු |
|---|---|---|
| රජය | | |
| රජයෙන් රජයට ණය (G-2-G) | එ.ජ. ඩො. මිලි. 1,000 | එ.ජ. ඩො. මිලි. 500 |
| බහු පාර්ශ්වීය ණය | එ.ජ. ඩො. මිලි. 300 | එ.ජ. ඩො. මිලි. 400 |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | එ.ජ. ඩො. මිලි. 300 | |
| රුපියල්වලින් වටිනාකම නාමකරණය කරන ලද රජයේ සුරැකුම්පත්හි ආයෝජන | එ.ජ. ඩො. මිලි. 250 | එ.ජ. ඩො. මිලි. 750 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කාණ්ඩ | | එ.ජ. ඩො. මිලි. 1,000 |
| ප්‍රයෝජනයට නොගත් වත්කම් මුදල් බවට පරිවර්තනය | එ.ජ. ඩො. මිලි. 500 | එ.ජ. ඩො. මිලි. 500 |
| අනෙකුත් විදේශීය සෘජු ආයෝජන (වරාය නගර ව්‍යාපෘතිය හැර) | එ.ජ. ඩො. මිලි. 300 | එ.ජ. ඩො. මිලි. 500 |
| නොපියවා ඉදිරියට ගෙනගිය අක්වෙරළ බැංකු ණය (Roll-overs) | එ.ජ. ඩො. මිලි. 200 | එ.ජ. ඩො. මිලි. 750 |
| ශ්‍රී ලංකා මහ බැංකුව | | |
| අනෙකුත් මහ බැංකු සමඟ ඇති කර ගන්නා මුදල් හුවමාරු ගිවිසුම් | එ.ජ. ඩො. මිලි. 1,000 | එ.ජ. ඩො. මිලි. 500 |
| කෙටි කාලීන / දිගු කාලීන දේශීය මුදල් හුවමාරු ගිවිසුම් | එ.ජ. ඩො. මිලි. 500 | එ.ජ. ඩො. මිලි. 500 |
| ඉන්ධන/අත්‍යවශ්‍ය ආනයනවලට පහසුකම් සැලසීමට අදාළ විකිණීම් (ආසන්න වශයෙන්) | (එ.ජ. ඩො. මිලි. 600) | (එ.ජ. ඩො. මිලි. 300) |
| ප්‍රේෂණ/අපනයන ආදායම මිල දී ගැනීම | එ.ජ. ඩො. මිලි. 150 | එ.ජ. ඩො. මිලි. 250 |

# ඉලක්කගත විදේශ විනිමය ලැබීම්වල කාලරාමු සාරාංශය - විදේශ විනිමය වෙළඳපොළ තුළ

| පාර්ශ්වකරු | 2021 ඔක්. - දෙසැ. | 2022 ජන. - මාර්තු |
|---|---|---|
| බැංකු අංශය | | |
| නව ණය ලබා ගැනීම් | එ.ජ.ඩො. මිලි. 500 | එ.ජ.ඩො. මිලි. 1,000 |
| විදේශ විනිමය තැන්පතු | එ.ජ.ඩො. මිලි. 300 | එ.ජ.ඩො. මිලි. 500 |
| වරාය නගරය වෙත ලැබීම් | | එ.ජ.ඩො. මිලි. 300 |
| කොළඹ කොටස් හුවමාරුව | | එ.ජ.ඩො. මිලි. 200 |
| වෙළඳ භාණ්ඩ අපනයනකරුවන් | එ.ජ.ඩො. මිලි. 3,300 | එ.ජ.ඩො. මිලි. 3,600 |
| විදෙස්ගත සේවකයන් | එ.ජ.ඩො. මිලි. 1,800 | එ.ජ.ඩො. මිලි. 2,000 |
| සේවා අපනයනකරුවන් (සංචාරක අංශය හැර) | එ.ජ.ඩො. මිලි. 1,000 | එ.ජ.ඩො. මිලි. 1,200 |
| සංචාරක අංශය | එ.ජ.ඩො. මිලි. 50 | එ.ජ.ඩො. මිලි. 300 |

# මැදි කාලයේ සිට දිගු කාලීනව ආර්ථිකයේ ගමන් මග අපේක්ෂිත මාවත ඔස්සේ ගෙන යෑමට මෙම ඉලක්ක සපුරාලන උපාය මාර්ග උපයෝගී වනු ඇත...

- එන්නත් කිරීමේ ක්‍රියාවලිය සාර්ථක වීමත් සමඟම, සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කරමින් රට ක්‍රමයෙන් විවෘත කිරීම තුළින් සෑම අංශයක්ම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ
- ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීම පුළුල් වනු ඇති අතර ඉදිරි කාලපරිච්ඡේදයේදී ආර්ථිකය වේගයෙන් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඵලදායී ලෙස ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, අවිධිමත් ව්‍යාපාර සහ දෛනික වැටුප් ලබන්නන් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඇතුළත් වේ
- ප්‍රාග්ධන වෙළෙඳපොළට අදාළ නව නීති හඳුන්වා දීමත් සමඟ ආයෝජන වාතාවරණය ක්‍රමයෙන් වැඩිදියුණු වනු ඇත.
- වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත ක්‍රියාත්මක කිරීම හා ප්‍රයෝජනයට නොගත් වත්කම් මුදල් බවට පත්කිරීමත් සමඟ තවත් සෘජු ආයෝජන ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ
- සංචාරක කර්මාන්තය වර්ධනය වීමත් සමග විදේශීය අංශයේ පීඩනය ක්‍රමයෙන් සාමාන්‍යකරණය වන අතර විනිමය අනුපාතයේ වැඩි ස්ථාවරත්වයක් සහ ජංගම ගිණුමේ ශේෂය හිතකර ලෙස වර්ධනය වීම සහ විදේශ විනිමය සංචිත වර්ධනය වීම අපේක්ෂා කෙරේ

ස්ථාවර මිල ගණන් සහ ශක්තිමත් සාර්ව ආර්ථික මූලිකාංග සමඟ මෙම නව ක්‍රියාමාර්ග ආර්ථිකයට වැඩි ස්ථාවරත්වයක් ලබාදෙන අතර එමඟින් ශක්තිමත් හා විනයකින් යුතු ආර්ථික තත්ත්වයක් කරා ළඟා වීමට හැකි වනු ඇත

# කෙටි කාලීන බාධක ජය ගැනීමෙන් පසුව, 2022 වසර සහ ඉන් ඉදිරියට වැඩි විශ්වාසයක් සහිතව ඉදිරියට යෑම අපගේ ඉලක්කයයි...

*2022 වසර අවසානය වනවිට තවත් ධනාත්මක ප්‍රතිඵලයන් අපි අපේක්ෂා කරන්නෙමු :*

- කොවිඩ්-19 වසංගත තත්ත්වය පාලනය කිරීමත් සමග ආර්ථික කටයුතු ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස මූර්ත ද.දේ.නි. යෙහි වර්ධනය 6%ක පමණ මට්ටමක පවත්වා ගැනීම
- උද්ධමනය 4-6% අතර අපේක්ෂිත ඉලක්කගත පරාසය තුළ ස්ථාවරව පවත්වා ගැනීම
- පොලී අනුපාතික තව දුරටත් ස්ථාවරව පවත්වා ගැනීම
- ව්‍යාපාර සඳහා වඩාත් හිතකර පරිසරයක් ඇති කිරීම සඳහා සංචාරක කර්මාන්තය නැවත නගාසිටුවීම
- ඉහළ ආයෝජන ප්‍රවාහ
- වැඩිදියුණු වූ සාර්ව ආර්ථික මූලිකාංග සමඟ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ යාම
- ශක්තිමත් සහ විනයකින් යුක්ත ආර්ථික තත්ත්වයක්

## මෙය ගතික සැලැස්මකි...

**ඉදිරියේදී අප විසින්**

**මෙම සැලැස්ම වැඩි දියුණු කිරීම,**

**එයට යම් හැඩ ගැසීම් සිදු කිරීම හෝ**

**එහි සමහර අංශ වෙනස් කිරීම පවා සිදු කරනු ඇත!**